**unit 12**

# බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය

වාගීශ්වර

- බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය
- පක්ෂ ක්‍රමය

sureka wageeshwara

# තානය්‍යය ආණ්ඩුක්‍රමය හැඳින්වීම / ලක්ෂණ

## බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය හැඳින්වීම / ලක්ෂණ

01. **ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන න්‍යාය මත පදනම් වී ගොඩ නැගුණු ආණ්ඩු ක්‍රමයක් වීම.**

ලෝකයේ ජනප්‍රියම සහ වැඩිම ව්‍යාප්තියක් ඇති දේශපාලන න්‍යාය වන ලිබරල් දේශපාලන න්‍යායේ මූලධර්ම මෙම ව්‍යවස්ථාව ගොඩනැගී තිබේ.

02. **ලිඛිත මෙන්ම නිර්ලිඛිත ලිඛිත ආණ්ඩුක්‍රමයක් වීම.**

බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් පවතින නීති තනි ලේඛනයක ලියා නොමැති නිසා එය නිර්ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලෙස හඳුන්වයි. නමුත් බ්‍රිතාන්‍ය තුළ ද ඇතැම් කරුණු ලේඛනගතවී තිබේ.

මැග්නාකාටා පනත.
අයිතිවාසිකම් පනත.
ප්‍රතිසංස්කරණ පනත.
පාර්ලිමේන්තු පනත.

03. **ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වීම.**

බ්‍රිතාන්‍ය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තනි එක් මධ්‍ය ආණ්ඩුවකට පමණක් බලතල පවරා තිබේ. එම නිසා එය ඒකීය ආණ්ඩුක්‍රමයක් ලෙස හඳුන්වයි. නමුත් පරිපාලන කටයුතු වල පහසුව සඳහා ප්‍රාදේශීය පාලන ඒකක වලට බලතල ව්‍යවස්ථාදායකය තුළ සම්මත කළ පනතකින් ලබාදී තිබේ.

නිදසුන් : කෝරලසභා , පේරුසභා , වසම්

04. **කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් වීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් යනු, ව්‍යවස්ථාදායකය තුළින් විධායකය වන කැබිනට් මණ්ඩලය තෝරාගන්නා ආණ්ඩු ක්‍රමයකි.

05. **පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය.**

පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය සීමාවන් - බාධාවන් නොමැත. විශේෂයෙන් අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය බ්‍රිතාන්‍යය කිසිඳු අධිකරණයකට නොමැත. එම නිසා පාර්ලිමේන්තුව ඉතා බලවත්ය. අධිකරණ තීරණය වෙනස් කිරීමට පවා පාර්ලිමේන්තුවට හැකිය.

## 06. නම්‍යය ආණ්ඩුක්‍රමයක් වීම.

ආණ්ඩුක්‍රම නීතියට අනුව බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාව නම්‍ය වේ. එනම් ව්‍යවස්ථාදායකයට සරල බහුතරයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකිය. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ව්‍යවස්ථාදායකය තුළ සාමාන්‍ය නීති සම්පාදනය කිරීමට අදාළ නෛතික පදනම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකිය. නමුත් ප්‍රායෝගික භාවිතය තුළ බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය දැඩි අනම්‍ය හැඩයක් ගනී.

## 07. විකාශනය වූ ආණ්ඩුක්‍රමයක් වීම. (නිර්මානය කළ ආණ්ඩුක්‍රමයක් නොවීම.)

බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය ඉතා දීර්ඝ විකාශනයක ප්‍රතිඵලයකි. විවිධ සම්ප්‍රධායයන්, පනත්, පූර්වාදර්ශ මතින් ආණ්ඩුක්‍රමය විකාශනය වී තිබේ.

## 08. න්‍යාය හා ක්‍රියාත්මකත වීම අතර වෙනස.

ව්‍යවස්ථාවේ මූලධර්ම සහ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය අතර පවතින වෙනස බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමයේ ප්‍රධානතම ලක්ෂණයකි.

නිදර්ශන : න්‍යායාත්මක තත්ත්වය තුළ නම්‍ය ආණ්ඩුක්‍රමයක් ලෙස දක්වා තිබුණ ද ප්‍රායෝගික තලය තුල දී දැඩි අනම්‍ය ව්‍යවස්ථාවක් වීම.

## 09. නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වීම.

සියලුම පුරවැසියන් නීතිය ඉදිරියේ සමාන ලෙස සැලකීම සහ සියලු දෙනාම නීතියට අවනත විය යුතු බව මින් ප්‍රකාශිතය. බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය තුළ ඇති වැදගත් ලක්ෂණයක් ලෙස එය දැක්විය හැකිය.

## 10. රාජාණ්ඩුක්‍රමයක් වීම.

රජු, රැජිණ කේන්ද්‍රකොටගෙන එරට සියලු කටයුතු කිරීම. රජුගේ නාමයෙන් සියලු පාලන කටයුතු සිදුවෙයි. නමුත් නූතනය තුළ රජු නාමික තත්ත්වයකට පමණක් පත්ව ඇත.

# ව්‍යවස්ථාදායක - පාර්ලිමේන්තුව

# ව්‍යවස්ථාදායක - පාර්ලිමේන්තුව

පොදු හැඳින්වීම

බ්‍රිතාන්‍යය ව්‍යවස්ථාදායකය ආයතනය පාර්ලිමේන්තුවයි. බ්‍රිතාන්‍යය ව්‍යවස්ථාදායකය "පාර්ලිමේන්තු වල මාතෘවරිය" යනුවෙන් හඳුන්වයි. එය නූතන ව්‍යවස්ථාදායක අතරින් පැරණි වූත්, බලවත් වූත් සිත්ගන්නා සුළු වූත් ලාක්ෂණිකයන්ගේ කැඩපත වෙයි. පාර්ලිමේන්තුවේ ව්‍යූහය **ද්වි මාණ්ඩලික වේ**.

(i) **නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (මහජන මන්ත්‍රී මණ්ඩලය)**
(ii) **සාමි මන්ත්‍රී මණ්ඩලය (උත්තර මන්ත්‍රී මණ්ඩලය)**

## ■ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය.

හැඳින්වීම

මොකක්ද:

"**ලෝකයේ ඉතාමත්ම වැදගත් මහජන රැස්වීම**" ලෙස සිඩ්නි ලෝ නැමැති විචාරකයා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හඳුන්වයි. ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුවේ පළමු සභාව වන නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉතාමත්ම බලවත්, හා වැදගත් මණ්ඩලය වේ. ඒ වැදගත් භාවයට **නිදර්ශන කිහිපයකි.**

- ඇමතිවරයකු යමක් පාර්ලිමේන්තුවෙන් විමසන්නේ නම් විමසන්නේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළිනි.
- රජින පාර්ලිමේන්තුව විසුරුවා හරින විට විසුරුවන්නේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයයි.
- නව පාර්ලිමේන්තුවක් යනු සරලව දක්වනුයේ නම් නව නියෝජිත මන්ත්‍රී මණ්ඩලයකි.
- විධායකය කැබිනට් මණ්ඩලය සාමූහිකව වගකිව යුත්තේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පමණි.

සංයුතිය :

මෙහි සාමාජික සංඛ්‍යාව සෑම වසර 10 කට වරක් පවත්වන ජන සංගනනයකින් අනතුරුව සංශෝධනය වේ. නූතනය තුළ සාමාජිකයින් 635 කි.

පත් කිරීම :

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඡන්දයෙන් තේරීපත් වන මණ්ඩලයකි ආරම්භක අවස්ථාව තුළ ඡන්ද බලය හිමි වූයේ වෙළෙඳුන් හා ශිල්පීන්ට පමණක් වූ නිසා ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් පමණක් මෙය සමන්විත විය. 18, 19, 20 සියවස්වල දී සමාන්‍ය ජනයාට ඡන්ද බලය හිමි වූ නිසා ඔවුන්ගේ නියෝජිතයන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත් විය. ප්‍රාදේශීය පදනමක් මත බෙදා වෙන් කරන ලද ඡන්ද කොට්ඨාස තුළින් සරල බහුතර නියෝජන ක්‍රමය මත පදනම් වී නියෝජිතයන් තෝරා පත් කර ගනී.

නිලකාලය: <u>නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නිලකාලය වසර 5 කි</u>. අගමැතිගේ උපදෙස් මත රජිණට ඊට පෙරද නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසුරුවා හැරිය හැකිය. එසේම හදිසි තත්ත්වයක් තුළ එහි ධූරකාලය දීර්ඝ කිරීමටද හැකිය.

නිදර්ශන -: 1910 තෝරාගත් නි.ම.ම 1918 තෙක් ධූරදැරීම.
1935 තෝරාගත් නි.ම.ම 1945 තෙක් ධූරදැරීම.

1623 සිට <u>නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සේවය අයිතියක් ලෙස නොව යුතුකමක් ලෙස නීතිගත කර තිබේ</u>. එම නිසා යම් ඇමතිවරයකුට අවශ්‍ය නම් මෙම මණ්ඩලයේ සේවයෙන් ඉවත් වී රාජ්‍යයේ වෙනත් තනතුරක් ලබාගැනීමේ අවකාශක් ද පවතී.

## ● <u>කාර්ය හා බලතල</u>

### (i) <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල</u>

නීති සම්පාදන කටයුතු පිළිබඳ අවසාන බලතල නියෝජිත මන්ත්‍රී මණ්ඩලය භුක්ති විඳී. රජින , සාමි මන්ත්‍රී මණ්ඩලය , නීති සම්පාදනයට දායක විය යුතු වුව ද එම ආයතන ඉක්මවා ගිය බලයක් නීති සම්පාදනය සම්බන්ධයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට තිබේ.

නිදර්ශන

- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට **මුදල් හා සාමාන්‍ය නීති** සම්පාදනය සම්බන්ධයෙන් බලතල ඇති අතර <u>මුදල් නීතියක් ආරම්භකිරීමට බලය ඇති එකම මණ්ඩලය වීම.</u>

- සාමි මන්ත්‍රී මණ්ඩලය ආරම්භකරන ලද සාමාන්‍ය පනත් කෙටුම් පතක් සම්මත කිරීමට - අනුමැතියකින් තොරව සංශෝධනය කිරීමට - කල් දැමීමට සහ ප්‍රතික්ෂේප කිරීමට බලය හිමි වීම.

- නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ආරම්භ කළ <u>මුදල් පනතක් එක් මසකට</u> <u>වඩා කල්</u> දැමීමටත්, <u>සාමාන්‍ය පනතක් එක් වසරකට වඩා</u> කල් දැමීමටත් සාමි මන්ත්‍රී මණ්ඩලයට නොහැකි වීම, මෙම කාලසීමාවට වඩා රඳවා තබා ගන්නේ නම් රජිණගේ අනුමැතිය මත එම පනත් නීතියක් බවට පත් කිරීමට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හැකිය.

- රජිණට පනත් අනුමැතිය සඳහා රඳවා තබා ගැනීමට නොහැකි වීම.

## (ii) <u>විධායක අංශයේ බලතල</u>.

★ **විධායකය පාලනය හා මෙහෙය වීම.**

එංගලන්ත ආණ්ඩුක්‍රමය කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයකි. එම නිසා ස්වකීය භූමිකාව (කාර්යයන්) සම්බන්ධයෙන් <u>විධායක කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට විශේෂයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සාමූහිකව වගකීමට බැදී ඇත</u>. එසේ වග නොකියන අවස්ථාවල දී නියෝජිත මන්ත්‍රී මණ්ඩය තුළ සම්මත කරනු ලබන <u>විශ්වාසභංග යෝජනාවක් හරහා කැබිනට් මණ්ඩලය වන විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයකට හැකිය.</u>

**තවදුරටත්,**

ප්‍රශ්න විචාරීම - විවේචනය කිරීම - තර්ජනය කිරීම - ආයාචනා කිරීම - මහජනමතය ඉදිරිපත් කිරීම - දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම වැනි ක්‍රියාමාර්ග හරහා ද විධායකය පාලනයට හැකියාව නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සතු වෙයි.

## (iii) <u>අධිකරණ අංශයේ බලතල</u>.

★ **විනිශ්චකාරවරුන් ඉවත්කිරීම.**

විනිශ්චයකාරවරයෙකු ඉවත් කිරීම සඳහා ව්‍යවස්ථාදායකයේ මණ්ඩල දෙක තුළ සම්මත කළ යෝජනාවකට නාමික විධායකය රැජින අනුමැතිය ලබාදිය යුතුය.

## (iv) <u>මූල්‍යමය බලතල</u>

ජාතියේ ධනය සම්බන්ධ සුවිශාල බලතල ප්‍රමාණයක් නියෝජිත මන්ත්‍රීමණ්ඩලය සතු වෙයි. ජාතිය සතු ධනය පාලනය කිරීමට ඇති ස්වාධිපතීත්වය මගින් එය පැහැදිලිය. මුදල් පනත් කෙටුම්පතක් ආරම්භකිරීමට බලතල ඇති එකම මණ්ඩලයවීම. සියලුම අයවැය හා බදු පිළිබඳ අවසාන අධිකාරී බලය එය සතු වීම. අයවැය ලේඛණය සම්මත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති ශක්‍යතාවය. ආණ්ඩුවට අවශ්‍ය මුදල් වෙන් කරනවා ගැනීම සහ වියදම් කිරීම මහජන මන්ත්‍රී මණ්ඩලයේ අනුමැතිය මත සිදුකල යුතු ය.

## (v) **මහජනතාවගේ දුක්ගැනිවිලි අවශ්‍යතාවයන් සොයා බැලීම.**

## (vi) **මන්ත්‍රීවරුන් පුහුණු කිරීම (අනාගත නායකයන් පුහුණු කිරීම)**

## (viii) **විධායක කාරක සභා පත් කිරීම.**

## (ix) **රාජසන කථාව අනුමත කිරීම.**

## (x) **මහජන මතය ඉදිරිපත් කිරීම.**

## ■ සාමි මන්ත්‍රී මණ්ඩලය.

හැඳින්වීම

මොකක්ද: ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ දෙවන මණ්ඩලය සාමි මන්ත්‍රී මණ්ඩලයයි. ලෝකයේ **දෙවන මණ්ඩල අතරින් පැරණිම මණ්ඩලය** මෙය වේ. සාමි මන්ත්‍රී මණ්ඩලය පාරම්පරික ආයතනයකි. 1295 වසරේ **I වන එඩ්වඩ් රජුගේ ආදර්ශ පාර්ලිමේන්තුව** යන සංකල්පය මතින් සාමි මන්ත්‍රී මණඩලය නිර්මාණය විය.

වෙබ්ස් (vebs) නැමැති විචාරකයාට අනුව නම්, **"සාමි මන්ත්‍රී මණඩලය යනු ප්‍රජාතන්ත්‍රවාදී රටක් තුළ දේශපාලනික වශයෙන් යල්පැන ගිය ආයතනයකි"**. තවත් ප්‍රකාශනයක් වන්නේ **"ජීවමාන කීර්තිධර පුද්ගලයන් වෙසෙන වෙස්ට් මිනිස්ටර් මාලිගාව"** යන්නයි.

සංයුතිය : මෙහි සාමාජිකයන් ප්‍රමාණය නිශ්චිත වශයෙන් දක්වා නොමැත. 1999 දී මෙහි සාමාජිකයන් 735 විය. නූතනය තුල මෙහි සාමි වරුන් 732 කි. සාමි මන්ත්‍රී මණ්ඩලයේ සාමිවරු වර්ග කිහිපයකි.

රාජකීය ලේ නෑකම් සහිත සාමිවරු
පාරම්පරික සාමිවරු
ස්කොට්ලන්ත සාමිවරු
නීති සාමිවරු
අයර්ලන්ත සාමිවරු
ආගමික සාමිවරු
යාවජීව සාමිවරු

(i) රාජකීය ලේ නෑකම් සහිත සාමිවරු.

මේ වර්ගයට අයත් වන්නේ රජ පවුලට ඍජු සම්බන්ධ කම් ඇති පරිනත වයසට පත් පිරිමි දරුවන්ය. ඔවුනට ආදිපාද යන ගෞරව නාමය පිරිනමා ඇත.

**නිදර්ශන** : කොන්වෝල් ආදිපාදවරයා
යෝක් ආදිපාදවරයා

මොවුන්ගේ සාමාජිකත්වය එතරම් වැදගත් නැත. ඉතාම කලාතුරකින් මොවුන් සාමි මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම් වලට සහභාගී වෙයි.

(ii) පාරම්පරික සාමිවරු.

සාමි මන්ත්‍රී මණ්ඩලයේ බහුතර සාමිවරු ප්‍රමාණයක් මෙම ගනයට අයත් වේ. සංඛ්‍යාත්මකව දක්වන්නේ නම් 9/10 ක් පමණ, මොවුන්ට මෙහි සාමාජිකත්වය හිමි ව ඇත්තේ ඥාති පෙලපත මගිනි. 1963 සිට කාන්තාවන්ද සාමි මන්ත්‍රී මණ්ඩලයට අයත් වේ.

(iii) <u>ස්කොට්ලන්ත සාමිවරු</u>.

මුල් අවධිය තුළ ස්කොට්ලන්තයේ වංශාධිපතියන් විසින් තෝරාගත් අතර 1963 පසුව පාරම්පරිකව තෝරාගැනීම සිදුවේ.

(iv) <u>අයර්ලන්ත සාමිවරු</u>.

එංගලන්තය හා අයර්ලන්තය ඒකාබද්ධ කිරීමේ පදනම මත අයර්ලන්ත සාමිවරු පත්කල අතර පසුව අයර්ලන්තය නිදහස් රාජ්‍යයක් ලෙස වෙන්වීමත් සමග සාමි මන්ත්‍රී මණ්ඩලය තුළ අයර් ලන්ත සාමිවරු නොමැත.

(v) <u>නීති සාමිවරු</u>.

අධිකරණ කටයුතු සිදු කරනු ලබන්නේ මෙම නීති සාමිවරු විසිනි. ඔවුන් ජීවිත කාලය පුරාම මෙහි සාමජිකත්වය ලබයි. ප්‍රකට නීතිවේදීන් මෙම තනතුරු සඳහා පත්කරන අතර 1990 සිට කිරීටය විසින් නීති සාමිවරු 21 ක් පත්කරයි.

(vi) <u>ආගමික සාමිවරු</u>

මොවුන් ප්‍රමාණය 26 කි. ඉන් <u>දෙදෙනෙක් යෝක් සහ කැන්ටබරිවල අගරදගුරු ප්‍රසාදිවරු වෙති</u>. අනෙක් 24 දෙනා එංගලන්ත සභාවේ රාජගුරු ප්‍රසාදිවරු වෙති. වින්චෙස්ටර්, ලන්ඩනයේ බිෂොප්වරු මේ අතර ප්‍රධාන වේ.

(vii) <u>යාවජීව සාමිවරු</u>

රජුයේ තනතුරුවල සිට විශ්‍රාම ගිය පුද්ගලයන් මෙහි සිටි මොවුන් සාමි මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු වල දී ඉතා සක්‍රීය භූමිකාවක් රඟ දක්වයි.

නිලකාලය

නිලකාලය සම්බන්ධයෙන් ඍජු විග්‍රහයන් දැක්විය නොහැකිය. මෙය පාරම්පරික ආයතනයක් වීම එයට හේතුවයි

- <u>කාර්ය හා බලතල</u>.

(i) <u>ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල</u>

සාමි මන්ත්‍රී මණ්ඩලයට නීති සම්පාදන කිරීමට බලතල ඇත. එය ප්‍රභේද දෙකක් යටතේ සාකච්ඡා කළ යුතු ය.

- මුදල් පනත් කෙටුම්පත්
- මුදල් නොවන පනත් කෙටුම්පත් (සාමාන්‍ය පනත් කෙටුම්පත්)

මුදල් පනත් කෙටුම්පත් ආරම්භ කිරීමට බලයක් නොමැත. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය අනුමත කරන ලද මුදල් පනත් කෙටුම් පතක් සම්මත කිරීමට - අනුමැතිය මත සංශෝධනය කිරීමට - එක් මාසයක් කල් දැමීමට හැකි අතර ප්‍රතික්ෂේප කළ නොහැකිය. මේ අනුව මුදල් කෙටුම්පත් සම්බන්ධයෙන් බලතල මෙයට නැති තරම්ය.

සාමාන්‍ය පනත් කෙටුම්පත් ආරම්භ කිරීමට හැකිය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ආරම්භ කරන ලද සාමාන්‍ය පනත් කෙටුම්පතක් සම්මත කිරීමට අනුමැතිය මත සංශෝධනයට එක් වසරක් කල් දැමීමට හැකි අතර ප්‍රතික්ෂේප කළ නොහැකිය.

## (ii) විධායක අංශයේ කාර්ය හා බලතල.

විධායකය වන කැබිනට් මණ්ඩලයට සාමාජිකයන් තෝරා ගැනීමේ දී සාමි මන්ත්‍රී මණ්ඩලයෙන් අවම වශයෙන් සාමාජිකයන් සිව්දෙනෙක් (4) ඒ සඳහා තෝරා ගනී. ඒ හරහා විධායක අංශයේ බලතල සාමි මන්ත්‍රී මණ්ඩලයට හිමි වේ.

විධායකය වන කැබිනට් මණ්ඩලය සෘජුව පාලනයට හා මෙහෙය වීමට සාමි මන්ත්‍රී මණ්ඩලයට නොහැකිය.නමුත් ප්‍රශ්න විචාරීම - විවේචනය කිරීම - විවාද පැවැත්වීම චෝදනා කිරීම වැනි වක්‍ර ක්‍රම හරහා විධායක කැබිනට් මණ්ඩලය උපහාසයට, අපහසුතාවයට පත් කිරීමෙන් කිසියම් ප්‍රමාණයකට විධායකය පාලනයට හා මෙහෙයවීමට සාමි මන්ත්‍රී මණ්ඩලයට හැකිය.

## (iv) අධිකරණ අංශයේ බලතල

- බ්‍රිතාන්‍යය ඉහලම අධිකරණ ආයතනය ලෙස කටයුතු කිරීම.
- අධිකරණ අමාත්‍යවරයා වන චාන්සලර් සාමිවරයා සාමි මන්ත්‍රී මණ්ඩලය තුලින් තෝරාපත් කිරීම.
- විනිශ්චකරුවන් ඉවත් කිරීමට සාමි මන්ත්‍රී මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වීම.

ඉහත ආකාරයට සාමි මන්ත්‍රී මණ්ඩලය ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ යන ත්‍රිවිධ අංශ සතු කාර්ය හා බලතල භුක්තිවිඳී.

- සාමි මන්ත්‍රී මණ්ඩලය සම්බන්ධයෙන් එල්ල වී ඇති විවිධ මතද හඳුනාගත යුතු ය.

  - දේශපාලන වශයෙන් යල් පැන ගිය එකක් වීම.
  - ධනය පිළිබඳ බලකොටුවක් ලෙස විග්‍රහ කිරීම.
  - දෙකට බෙදීමේ ස්වභාවය මත.
  - අක්‍රමවත් පැමිණීම.
  - බාධා කරන්නෙකු වීම.

□ <u>සාමි මන්ත්‍රී මණ්ඩලයේ උපයෝගීතාවය</u>

- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ කාලය ඉතිරිකිරීමේ වැඩපිළිවෙලක් ලෙස,
- ද්විමාණ්ඩලික වාදයේ වැදගත් භාවය මත
- නිපුන සාමාජිකත්වය මත
- උත්තරීතර අභියාචනා උසාවි මත
- සංශෝධන මණ්ඩලයක් වීම.
- විප්ලවය සිදු නොවීමට ඇති මෙවලක් වීම.

□ <u>සාමි මන්ත්‍රී මණ්ඩලයේ අනාගතය.</u>

සාමි මන්ත්‍රී මණ්ඩලය යල්පැන ගිය ආයතනයක් ලෙස නූතන විග්‍රහය තුල දක්නට ලැබුණ ද, මෙම ආයතනය ඉවත් කිරීමට සාම්ප්‍රදායික බ්‍රිතාන්‍යය වැසියා මැලිකමක් දක්වයි. නමුත් එය සංශෝධනය විය යුතු ආකාරය සම්බන්ධයෙන්, එයට ලබාදිය යුතු බලතල සම්බන්ධයෙන් පොදු එකඟතාවයක් නොමැත.

□ <u>නාමික විධායකය ද ඇතුලත් ය.</u>

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට <u>නාමික විධායකය වන රැජිණ ද</u> අයත් වේ. පනත් කෙටුම් පත් නීතියක් වීම සඳහා රැජිණගේ අවසාන අනුමැතිය අවශ්‍ය වේ.

## <u>බ්‍රිතාන්‍යය පාර්ලමේන්තුවේ ස්වාධිපත්‍යය</u>

● <u>පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය ( පරමාධිපත්‍යය ) අර්ථ නිරූපණය.</u>

**"ස්වාධිපති පාර්ලිමේන්තුවේ අභිමතයට යනුවෙන් අදහස් කරනු ලබන්නේ වෙනත් ආයතන වල බලපෑමකින් හෝ සීමාවකින් තොරව නීති සම්පාදනයට හැකියාව ඇති පාර්ලිමේන්තුවක් ය."**

**"ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවේ අභිමතයට අනුව ඕනෑම නීතියක් සම්පාදනයට - සංශෝධනයට - නිශේධනය කිරීමට පාර්ලිමේන්තුව සතු පරම සහ අසීමිත අධිකාරී බලය පාර්ලමේන්තු ස්වාධිපත්‍යය යනුවෙන් සංකේතවත් වේ."**

● <u>ස්වාධිපති පාර්ලිමේන්තුවක හඳුනාගත හැකි **ලක්ෂණ කිහිපයකි**.</u>

- නීති සම්පාදනය සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සමාන හෝ උසස් ආයතනයක් නොවීම.
- ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය සීමා කරන වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ නාමැති වීම.
- ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලයට බලපෑම් කිරීමට නොහැකි වීම.

- **<u>බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තුව ස්වාධිපති පාර්ලිමේන්තුවක් වේ පහත නිදර්ශන සමගින් එය සනාථ කල හැකිය</u>.**

<u>නිදර්ශන</u>.

(i) **බ්‍රිතාන්‍යය තුල අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය ක්‍රියාත්මක නොවීම.**

බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තුව සකස් කරන නීති වල ව්‍යවස්ථානුකුල භාවය පරීක්ෂාව කිසිදු අධිකරණයකට කළ නොහැකිය. එම නිසා පාර්ලිමේන්තුවට අවශ්‍යය ඕනෑම නීතියක් සම්පාදනය කළ හැකිය. එසේම පාර්ලිමේන්තුව සම්මත කරන ලද නීතියක් අවලංගු කිරීමට ඇති එකම මාර්ගය වන්නේ වෙනත් පාර්ලිමේන්තු පනතක් මගින් එය සංශෝධනය කිරීම හෝ නිශේධ කිරීමයි.

(ii) **අධිකරණ තීරණ වෙනස් කිරීමට (සංශෝධනය කිරීමට) පාර්ලිමේන්තුවට හැකිවීම.**

නිදසුන් : 1901 ටැෆ්වේල් නඩුතීන්දුව 1906 වෘත්තිය අර්බුද නිරාකරණ පනත මගින් වෙනස් කිරීම.

(iii) **මූල්‍ය කටයුතු සහ පරිපාලන කටයුතු පිළිබඳ විශාල බලතල ප්‍රමාණයක් සතු වීම.**

ඕනෑම ප්‍රඥප්තියක්, සම්මුතියක් හෝ ව්‍යවස්ථාමය පනතක් වෙනස් කිරීමට සංශෝධනය කිරීමට අවලංගු කිරීමට හැකි වීම, අධිකරණ තීරන පවා ක්‍රියාත්මක නොවන පරිදි කටයුතු කිරීමට ඇති හැකියාව, ඕනෑම බද්ධක් අය කරගත හැකි අතර ඕනෑම සම්ප්‍රධායක් නතර කිරීමට ඇති හැකියාව.

(iv) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය සම්බන්ධ පූර්ණ බලතල ව්‍යවස්ථාදායකය සතුවීම.**

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට සාමාන්‍ය පනත් කෙටුම්පත් සකස්කිරීමට අදාළ නෛතික පදනම වන ව්‍යවස්ථාදායකයේ (1/2) ක සරල බහුතරයකින් රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකිය.

(v) **විවිධ දේශපාලන විචාරකයින්ගේ නිර්වචන මත.**

<u>"ලොල්මේ"</u> ට අනුව,

**"පාර්ලිමේන්තුවට ගැහැණියෙකු මිනිසෙක් කිරීමත්, මිනිසෙකු ගැහැනියක් කිරීමත් හැර වෙනත් ඕනෑම දෙයක් කිරීමට හැකිය."**

<u>"බ්ලැක්ස්ටන්"</u> අනුව,

**"පාර්ලිමේන්තුවට ඕනෑම වර්ගයක නිති සකස් කිරීමටත් ඒ වාට අනුමැතිය දීමටත්, ඒවා අර්ථකතනය කිරීමටත්, පරමාධිකාරී සහ අසීමිත බලයත් තිබේ."**

<u>"මැරියට්"</u>ට අනුව,

**"ඕනෑම දෘෂ්ටියකින් බැලුවහොත් බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තුවට පුදුමාකාර වූ බලයක් ඇති ආයතනයකි."**

## රජු (රැජිණ) හා කිරීටය.

අමතර කියවීම

බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය තුළ පවතින සුවිශේෂී ආයතන දෙකක් ලෙස රැජිණ හා කිරීටය දැක්විය හැකිය. ප්‍රයෝගික භාවිතය තුළ මෙම ආයතන දෙක එකක් ලෙස සාකච්ඡා කිරීම හඳුනාගත හැකි මුත් න්‍යායික විග්‍රහය තුල මෙම ආයතන දෙක අතර ඉතා පැහැදිලි වෙනස්කම් තිබෙයි.

රැජින හා කිරීටය අතර ඇති වෙනස වන්නේ පුද්ගල වශයෙන් රජු හා ආයතනයක් වශයෙන් කිරීටය අතර ඇති වෙනසයි. මෙය තව දුරටත් සරල කරනුයේ නම්, රැජිණ යනු එක් පුද්ගලයෙක් වන අතර කිරීටය යනු සාමූහිකත්වයක ප්‍රතිමූර්තියකි. මෙම වෙනස තවදුරටත් පැහැදිලි කිරීම,

බ්ලැක්ස්ටන්ට අනුව,

**"හෙන්රි, ඩේවිඩ්, ජෝර්ජ් මරණයට පත්වීමට ඉඩ ඇති මුත් රජු ඔවුන් සියලු දෙනාම අභිබවා පැවැත්වේ."**

මෙහිදී රජු යන්නෙන් බ්ලැක්ස්ටන් අවධාරණය කලේ රාජත්වයත් එය පිළිබඳ ආයතන වන කිරීටයත්ය. කිරීටය ආයතනයක් වන බැවින් කිසි දිනක එය මරණයට පත් නොවේ.

මුන්රෝට අනුව,

**"කිරීටයේ බලතල සහ ක්‍රියා පටි පාටිය රජුගේ මරණයත් සමඟ මොහොතකට හෝ අත්හිටුවනු නොලැබේ. කිරීමටය යනු කිසිදාක නොයිපදුණු හෝ කිසිදාක නොමැරෙන කෘත්‍රිම හා අධිකරණමය ආයතනයක් වේ."**

ආචාර්ය ෆයිනර් ට අනුව,

**"දේශපාලන ක්ෂේත්‍රය තුළ කිරීටයේ ක්‍රියාකාරීත්වය ගැන කතාකිරීමේ දී විධිමත් වැඩ පිළිවෙල සඳහා මහජනතාව, පාර්ලිමේන්තුව සහ කැබිනට් මණ්ඩලය විසින් ප්‍රධාන බලවේග සපයනු ලැබ ඇත. දේශපාලන ශක්තිය පිළිබඳ මේ සියලුම ඵලදායී මධ්‍යස්ථන වලට පලදවන්නා වූ හිස්වැස්ම කිරීටයයි."**

ඔහුට අනුව කිරීටය යනු, ස්වාධිපති ඇමතිවරුන්ගෙන් ද තරමක් දුරට පාර්ලිමේන්තුවේ ද සියුම් සංයෝගයකි. කිරීටය යනු තවදුරටත් පැහැදිලි කරන්නේ නම්, ඓතිහාසික තත්ත්වය තුළ 'රජු' බුක්තිවිඳිමින් තිබූ බලතල හා වරප්‍රසාද පවරන ලද ආයතනය වෙයි. එය, නෛතික වශයෙන් රජු මගින් මූර්තිමත් කරනු ලබන අතර එහි ඉතාම මූර්ත දෘශ්‍ය සත්‍ය වන්නේ කැබිනට් මණ්ඩලයයි.

තව දුරටත් රජු හා කිරීටය අතර ඇති වෙනස පහත කරුණු මත පැහැදිලි වේ.

(i) රජු පුද්ගලයකු වන අතර කිරීටය සංස්ථාවකි. රජු සංස්ථාගත කළ විට එය කිරීටය නම් වේ.

(ii) රජු මරණයට පත් වේ. නමුත් කිරීටය අමරණීය වේ. රජුගේ මරණය කිරීටයේ මරණය ලෙස දැක්වීම වැරදිය.

(iii) රජු රාජ්‍යයේ එක් කොටසක් පමණි.රජු හැරුණු විට අමාත්‍යවරුන් ද පාර්ලිමේන්තුව ද කිරීටයේ කොටසක් වේ.

(iv) රජු වනාහි රජයේ බලතල පාවිච්චි කරන පුද්ගලයෙකු පමණි.

# විධායකය

නාමික විධායකය

කැබිනට් මණ්ඩලය

අගමැතිවරයා

## නා මික විධායකය (රජු - රැජිණ)

හැඳින්වීම.

කවුද:

බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පිහිටුවා ඇති නාමික විධායකය රැජිනයි. **රැජිණ රාජ්‍යය නායකයා - විධායකයේ ප්‍රධානියා - සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා වේ.**

පත්කිරීම්

සිහසුනට පත් වීම සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමේ දී (ඇන්ග්ලෝ සැක්සන්) අවධියේ දී රාජ්‍යත්වය තෝරා පත් කර ගන්නා ලද්දකි. විටාන් 'vitan' මණ්ඩලය විසින් රාජකීය පවුල් අතරින් සුදුසු අයෙකු තෝරාගැනීම සිදු කරන ලදි. නමුත් පසු කාලීනව රාජ්‍යත්වය උරුමයෙන් හිමි වන්නක් බවට පත් විය. දැන් එය බ්‍රිතාන්‍යය තුළ සම්ප්‍රදායක් බවට පත්ව තිබෙයි. රාජ්‍යයත්වය හිමි වීමේ උරුමය තීරණය වන්නේ "දෙටු පිළිවෙල" යන න්‍යාය මතය.

නිදර්ශන : බාලයාට වඩා වැඩුමලාටත් ගැහැණියට වඩා පුරුෂයාටත් මූලිකත්වය ලැබෙයි.

රාජ්‍යයත්වයට පත් වන්නා ප්‍රොතෙස්තන්ත්‍ර ලබ්දියෙකු විය යුතු ය. රාජ්‍යයත්වයට පත්වන පුද්ගලයා බාලයකු නම් (වයස 18 ට අඩු නම්) රජු වෙනුවට සේවය කරන අනුශාසක තනතුරකට පත්කරනු ලබයි. මෙම තනතුර ජාත්‍යන්තර වශයෙන් ගෞරවයට පාත්‍රවන තනතුරක් වන අතර පොදු රාජ්‍යය මණ්ඩලීය නායකයා බවට පත්වන්නේ රජු හෝ රැජින බවට පත්වන පුද්ගලයාය.

සේවා කාලය ඉවත් කිරීම්

සේවාකාලය (නිල කාලය) සම්බන්ධයෙන් සීමාවක් නැත. ජීවිතාන්තය දක්වා රජ පදවිය භුක්ති විඳය හැකිය. රජ පදවිය දරන්නා ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුව ගෙන එන පනතකට රාජකීය අනුමැතිය ලැබිය යුතු ය.

නිදර්ශන : 1936 VIII එඩ්වඩ් රජු ඉවත් කිරීම.

■ රැජිනගේ කාර්ය හා බලතල.

- ව්‍යවස්ථාදායක කාර්ය හා බලතල (භූමිකාව)

(i) **සෑම පනත් කෙටුම් පතකටම අවසාන අනුමැතිය දීම. (රාජකීය අනුමැතිය දීම)**

න්‍යායාත්මක තලය තුල දී පාර්ලිමේන්තුව සකස් කරන පනත් කෙටුම්පත් නීති බවට පත් වන්නේ රැජිණගේ අනුමැතිය මගිනි. එසේ අනුමැතිය දීම සම්ප්‍රධායක් වන අතර රැජින විසින් කිසිදු පනතක් ප්‍රතික්ෂේප කිරීම, නිශේධනය කිරීම සිදු නොකරයි.

පසුගිය වසර 200 ක කාලය තුළ පනත් කෙටුම්පත් කිසිවක් නිශේධ කර නොමැත. රජු ව්‍යවස්ථා කෙටුම්පත් කියවන්නේ වත් නැත. රජුගේ අමාත්‍යවරු එම පනතට විරුද්ධ වන්නේ නම් එය සම්මත වන්නේ නැත. එම නිසා රජු සෑම පනතක්ම අනුමත කර නීතියක් බවට පත් කරයි. රජුගේ නිශේධබලය දැන් අභාවයට ගොස් ඇත.

නිදර්ශන : 1936 දී VIII වන එඩ්වඩ් රජු සිහසුන අතහැරීම පිළිබඳ පනත පාර්ලිමේන්තුව සම්මත කළ විට එඩ්වඩ් රජු එම පනතටද රාජකීය අනුමැතිය දී සිහසුන අතහැර දැමීය.

(ii) **ව්‍යවස්ථාදායකය කැඳවීම, කල්දැමීම, විසුරුවා හැරීම.**

පාර්ලිමේන්තුව විසුරුවා හරින විට විසිරී යන්නේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය පමණි

(iii) **විශේෂ අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම.**

(iv) **රාජාඥා නිකුත් කිරීම.**

(v) **ව්‍යවස්ථාදායකයට පණිවුඩ යැවීම සහ ව්‍යවස්ථාදායකය ඇමතීම.**

මෙම බලතල අගමැතිවරයාගේ උපදෙස් මත ක්‍රියාත්මක කිරීමට නාමික විධායකය වන රජුට හෝ රැජිණට සිදුවෙයි.

● <u>විධායක අංශයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>.

(i) **අගමැති පත් කිරීම.**

අගමැති පත් කිරීම රැජිණ නාමික විධායකය සතු ඉතාමත් වැදගත් කාර්යයක් ලෙස හඳුනාගත හැකිය. <u>රැජින විසින් අගමැතිගේ උපදෙසකින් තොරව කරනු ලබන එකම ක්‍රියාව මෙය වේ.</u> නමුත් රැජිනට එම පත් කිරීම ස්වකීය අභිමතය මත සිදු කළ නොහැකිය. <u>ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව තුළ බහුතරයකගේ අනුමැතිය දිනාගත් මන්ත්‍රීවරයා අගමැති ලෙස පත් කිරීමට රැජිණට සිදුවේ</u>.

**රැජින විසින් නව අගමැතිවරයෙකු තෝරාපත් කරනු ලබන අවස්ථා කිහිපයකි,**

*<u>මහ මැතිවරණයකින් පසුව</u>*.

සාමාන්‍යය න්‍යායික තත්ත්වය තුල දී වසර 5 කට වරක් බ්‍රිතාන්‍යය තුළ මහ මැතිවරණයක් පවත්වයි. එ ය පැවැත්වීමෙන් අනතුරුව ව්‍යවස්ථාදායකයේ වැඩිම ආසන ප්‍රමාණයක් දිනාගත් දේශපාලන පක්ෂයේ නායකයා අගමැති වරයා ලෙස රැජිණ විසින් තෝරාපත් කරයි.

*<u>පාර්ලිමේන්තුවේ විශ්වාස භංගයෝජනාවක් සම්මුඛ වූ විට</u>*.

මෙවැනි තත්ත්වයක් තුල විරුද්ධ පක්ෂයේ නායකයා අගමැතිවරයා ලෙස තෝරාපත් කිරීම සාමාන්‍යයෙන් සිදු වේ.

*<u>අගමැති මියයාමකින් හෝ ඉල්ලා අස්වීමකින් අනතුරුව.</u>*

මෙවැනි විටක දී සාමාන්‍යයෙන් සිදුවන්නේ එම පක්ෂයේ මීළඟ නායකයා අගමැති ධූරයට තෝරා පත් කිරීමයි.

(ii) **අමාත්‍යය මණ්ඩලය පත් කිරීම.**

අගමැතිවරයා විසින් පාර්ලිමේන්තුව තුළින් තෝරා ගනු ලබන මන්ත්‍රීවරුන් අමාත්‍යය මණ්ඩලය ලෙස රැජිණ විසින් තෝරා පත් කිරීමයි.

(iii) **රාජසන කථාව කියවීම.**

(iv) **රජුගේ උසස් නිළධාරීන් පත් කිරීම.**

විධායක පරිපාලන නිළධාරීන්, රාජගුරු ප්‍රසාදිවරුන්, ත්‍රිවිධ හමුදාපති වරුන්, පොලිස් වැනි උසස් තනතුරු අදාළ වේ.

(v) **තානාපතිවරු පත් කර යැවීම සහ පත්කර එවන ලද තානාපතිවරු පිළිගැනීම.**

(vi) **සන්නද්ධ සේවාවන්හි සේනාධි නායකයා ලෙස කටයුතු කිරීම.**

(vii) **යටත් විජිත හා ඩොමේනියන් රාජ්‍ය සමග සම්බන්ධතා පැවැත්වීම.**

(viii) **වරද කරුවන්ට දඩුවම් දීම සහ තරවටු කිරීම පිළිබඳ බලය උසුලනු ලබයි.**

(ix) **නම්බුනාම ප්‍රධානය කිරීම.**

(x) **රාජ්‍යයේ කටයුතු වල දී අනුසාසනා කිරීම.**

රැජිණ පාරම්පරික ආයතනයක් නිසා දීර්ඝකාලීන දේශපාලන අද්දැකීම් හිමිය. එම නිසා විවිධ කටයුතු වල දී අගමැති රැජිණගේ උපදෙස් විමසයි. විශේෂයෙන් ජාතික හා ජාත්‍යන්තර කටයුතු වලදී මෙම උපදෙස් විමසීම දැකගත හැකිය. නමුත් මෙම උපදෙස් පිළිගැනීමට අගමැතිවරයා බැඳී නැත. තවදුරටත් අගමැතිවරයාගේ අනුමැතිය මත කැබිනට් අමාත්‍යවරුන්ට ද රැජිණගේ උපදෙස් විමසිය හැකිය.

- අධිකරණ අංශයේ කාර්යය හා බලතල (භූමිකාව).

"**සාධාරණත්වයේ උල්පත රජුය**" මෙය මහා බ්‍රිතාන්‍යය තුළ ප්‍රකට ප්‍රකාශනයකි. ඉන් ගම්‍ය වන්නේ රැජිනට අධිකරණ අංශයේ ද බලතල හිමිව ඇති බවයි.

(i) **උසස් අධිකරණ ආයතන වලට විනිශ්චකාරවරු පත් කිරීම.**
(ii) **වරද කරුවන්ට සමාව දීම.**

න්‍යායික තලය තුල දී ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ ආදී අංශවල බලතල රැජිණට තිබුණ ද ප්‍රායෝගික තලය තුළ දී මේ සියලු බලතල අගමැතිවරයාගේ උපදෙස් මත සිදු කළ යුතු ය. එම නිසා රැජිනට නාමික තත්ත්වයක් පමණක් හිමිවී ඇත.

"රජු රජකම් කලත් රට පාලනය නොකරයි"
-සර් හෙන්රි මෙන්-

- <u>රැජිණගේ චාරිත්‍රානුකූල බලතල (භූමිකාව)</u>

(i) **<u>පල්ලියේ ප්‍රධානියා වීම</u>.**

බ්‍රිතාන්‍යය පල්ලියේ ප්‍රධානියා වන්නේ රැජිණයි. අගරදගුරු සහ අගරදගුරු ප්‍රසාදිවරුන් අගමැතිගේ උපදෙස් මත රැජිණ විසින් පත්කරයි.

(ii) **<u>පොදු රාජ්‍ය මණ්ඩලයේ ප්‍රධානියා වීම</u>.**

පොදුරාජ්‍යය මණ්ඩලයට අයත් රටවල් අතර එක්සත් භාවය සහයෝගය බ්‍රිතාන්‍යය රැජිණ විසින් සංකේතවත් කරනු ලබයි. එහි ප්‍රධානියා වන්නේ රැජිණයි.

නාමික විධායකය වන රැජින සම්බන්ධ කතිකාවතේ දී **<u>"රැජිණගේ නිර්දෝෂීභාවය"</u>** සම්බන්ධයෙන් ද සටහන් තැබිය යුතු ය. රැජිනගේ නිර්දෝෂීභාවය යන සිද්ධාන්තය බ්‍රිතාන්‍යය ව්‍යවස්ථාමය ව්‍යුහය තුළ ඇති වැදගත් සංකල්පයකි. මේ සිද්ධාන්තය තුළ වැදගත් කරුණු කිහිපයක් අන්තර්ගතය.

- **රජු නීතියට යටත් නොවන බව.**

  රජු හෝ රැජිණ විසින් කරන ලද වැරදි ක්‍රියාවකට රජුට හෝ රැජිණට විරුද්ධව නඩු පැවරිය නොහැකිය.රජු වරදයක් කරන්නේ නම් ඔහුට අධිකරණය ඉදිරියේ නඩු පැවරීමට ඉංග්‍රීසි නීතිය තුළ ක්‍රියාමාර්ග නැත.

- **රජුගේ නාමයෙන් කෙරෙන සියලුම කටයුතු වලට රජු කිසිදු වගකීමක් නොදරන බව.**

- **රජුගේ නාමයෙන් බ්‍රිතාන්‍යය ආණ්ඩුව මගින් කෙරෙන සෑම ක්‍රියාවකටම එම විෂය භාර අමාත්‍යවරයා වගකිව යුතු බව.**

- <u>රජු (රැජින) ගේ උපයෝගීතාවය</u>

රැජිණ පාරම්පරික ආයතනයක් වුවද රැජිණගේ උපයෝගීතාවය ප්‍රතික්ෂේප කල නොහැකි සත්‍යයකි. <u>රජු, රැජිණගේ ප්‍රායෝගික භාවිතාව සමාජ, ආර්ථික, දේශපාලනික සංස්කෘතික ආදී සියලු මානයන් තුළ ව්‍යාප්තව ඇත</u>.

නිදර්ශනඃ රජු, රැජිණ, ඇසීමට හෝ දැකීමට අපහසු ව්‍යවස්ථාසය වැඩ පිළිවෙලකට වඩා ජනතාවගේ පරිකල්පනයට ඉතා පහසුවෙන් ගොදුරුවන පෞද්ගලික සහ දර්ශනීය අංග සපයයි. **උපාය ගුණය, දයාන්විතභාවය, සහ ත්‍යාගශීලී භාවය** දක්වමින් මෙම භූමිකාව දක්ෂ අන්දමින් රඟ පෑ හැකි රජෙක් හෝ රැජිනක් තෘප්තිමත් හා යහපත් රජයක් ඇතිකිරීම අගය කළ නොහැකි තරම් තත්ත්වයක් ඉටුකරයි. නාමික විධායකයෙන් සිදුවන නිල නොවූ සමාජීය බලපෑම ඔහුගේ පෞද්ගලික චරිත ස්වභාවයට ඉතාම සමීප සම්බන්ධයක් දක්වයි. **ආගම, සදාචාරය, පරිත්‍යාගශීලීභාවය, මොස්තර සම්පන්න බව කලාව සහ සාහිත්‍යය** යන අංශ වලදී ඔහුගේ හෝ ඇයගේ බලපෑම අතිමහත් ය. රජු හෝ රැජිණ කිසිම පක්ෂයකට අයත් නොවේ.

තනතුරු හෝ නම්බුනාම උදෙසා ඔහු කේබල් නොකරයි. ඔහුට රටේ සුබසාධනය ආරක්ෂා කිරීම යන ශ්‍රේෂ්ඨ බලාපොරොත්තුව මිස තෘප්තිමත් කලයුතු වෙනත් බලාපොරොත්තුවක් නැත්තේ ය. මෙම තත්ත්වය නිසා බ්‍රිතාන්‍යය දේශපාන ලේඛන තුල රජු මෙසේ හඳුන්වයි.

**"අපේ ජාතික ඉතිහාසයේ ජීවමාන සංකේතය රජුය"**

-බැෆ්ලර් සිටුවරයා-

**"කිරීටය සතු උපදෙස් දීමේ අයිතිය කරුණු විමසීමේ අයිතිය හා දිරිමත් කිරීමේ අයිතිය හේතුකොට ගෙන බ්‍රිතාන්‍යය දේශපාලන ක්‍රමය තුළ කිරීටය සතු බලපෑම් කිරීමේ හැකියාව අවතක්සේරු නොකළ යුතු ය."**

-වෝල්ටර් -

## ● කැබිනට් මණ්ඩලයේ ආරම්භය හා විකාශනය.

අමතර කියවීම

**බ්‍රිතාන්‍ය කැබිනට් මණ්ඩලය දීර්ඝ ඓතිහාසික විකාශනයක ප්‍රතිඵලයකි.**

කැබිනට් මණ්ඩලය නිර්මාණයට අදාළ මූලාරම්භක තත්ත්වයන් නෝමන් අවධියේ පැවති ප්‍රිවිකවුන්සලය හරහා උත්පාද විය.

ප්‍රිවිකවුන්සලය යනු රජුට උපදෙස් ලබාගැනීමටත්, දෛනික පරිපාලන කටයුතු සම්බන්ධයෙන් රජුට සහාය වීමටත් පැවති මණ්ඩලය විය. මෙම ප්‍රිවිකවුන්සලයට සාමාජිකයන් තෝරාපත්කර ගැනීම සිදු වූයේ රජුගේ අභිමතානුසාරී කැමැත්ත මතය. කල් ගතවීමක් සමඟ මෙහි විශාල සාමාජික ප්‍රමාණයකින් යුක්ත මණ්ඩලයක් බවට පත්ව තිබුණි.

මෙහිදී උත්ගත වූ තත්ත්වය වූයේ රජුට දේශපාලනික වශයෙන් වැදගත් කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීමට විශාල පිරිසකගෙන් ඒ ගැන විමසීමට සිදුවීමත් සමඟ රජු වෙහෙසට පත්වීම සහ ඒ සඳහා විශාල කාලයක් වැය කිරීමට සිදුවීමයි. එම නිසා සිදු වූයේ රජු විසින් උපදෙස් ලබාගැනීමට වඩාත් ප්‍රිය කරන කණ්ඩායමක් ප්‍රිවිකවුන්සලය තුළින් වෙනම තෝරාපත් කර ගැනීමයි. මෙසේ රජු විසින් ප්‍රිවිකවුන්සලය තුලින් වෙනම මණ්ඩලයක් තෝරාපත් කර ගනිමින් උපදෙස් ගැනීමේ ක්‍රමය කුමන කාලවකවානුවක නිර්මාණය වූයේ දැයි නිශ්චිතව දැක්විය නොහැකිය.

රජු ප්‍රිවිකවුන්සලය තුළින් වෙනම මණ්ඩලයක් තෝරාගෙන සිය කටයුතු කළ බවට නිදර්ශනයක් දැක්වීම වැදගත් වෙයි.

(1660 - 1685) අතර කාලයේ II වන චාල්ස් රජු තමාට උපදෙස් ලබාගැනීම සඳහා එවැනි සමීපත සගයන් හත්දෙනෙකු තෝරාගෙන තිබෙයි. මෙම සමීපතයන්ගේ කණ්ඩායම (**CABAL**) "කබාල්" යනුවෙන් හඳුන්වා තිබෙයි. "කබාල්" යන භාෂාමය වාග් සංකේතය නිර්මාණය වන්නේ එම සගයන් පස් දෙනෙකුගේ නාමයන්ගේ මුල් අක්ෂර පදනම් වීමෙනි. මෙම කබාල් මණ්ඩලය පාර්ලිමේන්තුවට වගනොකී අතර රජුගේ කැමැත්ත ඇතිතාක් කල් ධූර දැරීය.

1688 උත්කෘෂ්ට විප්ලවය ආසන්න අවධිය තුළ අප වර්තමානයේ හඳුනා ගනු ලබන ස්වරූපයයේ කැබිනට් මණ්ඩලයක් බ්‍රිතාන්‍ය දේශපාලනය තුළ දක්නට නොවුනි.

1688 උත්කෘෂ්ට විප්ලවයත්, 1701 නිරාකරණ පනතත් පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය ඇති කිරීමට මඟ පෑදීය. ඒ හරහා කැබිනට් ක්‍රමය වර්ධනය වීමට ද අවකාශය සැලසිනි. ඒ හරහා III වන විලියම් රජු සිහසුනට පත්වීමත් සමඟ ඔහු පාර්ලිමේන්තුවේ ප්‍රධාන පක්ෂ දෙක තුලින්ම තම උපදේශක මණ්ඩලයට නියෝජිතයන් තෝරාගනී. නමුත් මෙයද කැබිනට් ක්‍රමය වර්ධනයට බාධාවක් විය. පසුව රජු 'විග්' පක්ෂයෙන් පමණක් තම උපදේශක මණ්ඩලය තෝරාගත්තේ ය. එම සම්ප්‍රදාය විකාශනයවීමේ ප්‍රතිඵලයක් ලෙස බහුතර පක්ෂයේ සාමාජිකයන් ගෙන් උපදේශක මණ්ඩලය තෝරාගැනීමේ සම්ප්‍රධායක් ඇති විය.

"සුන්ඩන් ලන්තයේ චුන්ටාව" ලෙස සලකන 1697 කැබිනට් මණ්ඩලය කැබිනට් ක්‍රමයේ නියම ආරම්භය ලස සලකනු ලබයි. එයට හේතුව වන්නේ, එම කැබිනට් සාමාජිකයන් පාර්ලිමේන්තුවේ බහුතර බලය ඇති පක්ෂයෙන් තෝරා ගැනීමයි. කැබිනට් ක්‍රමයට අදාළ ප්‍රධාන ආයතනය වන අගමැතිගේ රික්තකය I වන ජෝර්ජ් රජු විසින් සම්පූර්ණ කරන ලදි. I වන ජෝර්ජ් රජු ස්වකීය ඉංග්‍රීසි භාෂාවේ නොහැකියාව නිසා කැබිනට් මණ්ඩලයේ මුලසුන නොදැරීය. ඔහු එම කටයුතු තම අමාත්‍යවරයෙකු වූ රොබට් වල්පෝල් ට පවරන ලදි. වල්පෝල් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නායකයා ලෙස කටයුතු කරමින් කැබිනට් මණ්ඩලයේ මුලසුන දැරීය. ඔහුට එම ධූයේ ධූර දැරීමට හැකියාව තිබුණේ පාර්ලිමේන්තුවේ බහුතර අනුමැතිය ඇති තාක් පමණි. මෙලෙස කැබිනට් ක්‍රමයට අදාළ ප්‍රධානතම ලක්ෂණ වල්පෝල්ගේ පාලන අවධිය තුළ ඇතිවිය. මොහු බ්‍රිතාන්‍ය පළමු අගමැති වරයා වන්නේය.

**19 වැනි සියවස තුල දී කැබිනට් ක්‍රමය වඩාත් පැහැදිලි බවක් පෙනෙන්නට තිබුණි. ඊට අදාළව,**

- අමාත්‍යවරු පාර්ලිමේන්තුවේ සාමාජිකයන් විය යුතු බව
- ඔවුන්ට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බහුතරය තිබිය යුතු බව.
- සියලු දෙනා එකම පක්ෂයක අය විය යුතු බව.
- අගමැතිගේ නායකත්වය යටතේ සංවිධානය විය යුතු බව.

**අමතර කියවීම**

● <u>කැබිනට් මණ්ඩලය සහ අමාත්‍ය මණ්ඩලය අතර වෙනස.</u>

කැබිනට් මණ්ඩලය පිළිබඳ සංවාදයේදී, කැබිනට් මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩලය අතර වෙනස හඳුනාගත යුතු ය, බොහෝ විට මෙම වාක් සංකේත යුග්මය සම අර්ථ සහිතව භාවිතා කරන ආකාරය දේශපාලන සාහිත්‍යය තුළ දැකගත හැකිය<u>. නමුත් මෙම වාග් සංකේත යුග්මය හරහා ආණ්ඩුවේ එකිනෙකාට වෙනස් කොටස් දෙකක් ගැන හැඳින්වේ</u>.

කැබිනට් මණ්ඩලය සහ අමාත්‍යය මණ්ඩලය අතර වෙනස ආකාර දෙකකට හඳුනාගත හැකිය.

(i) ආයතන ව්‍යුහය මත.
(ii) ආයතනට අනුබද්ධ කාර්යයන් මත.

**● අමාත්‍යය මණ්ඩලය යනු,**

අමාත්‍යය මණ්ඩලය යනු පාර්ලිමේන්තුවේ ආසන හිමි කිරීටයේ සියලුම නිලධාරීන්ගෙන් සමන්විත විශාල මණ්ඩලයකි. මෙහි පස් ආකාරයකින් යුත් අමාත්‍යවරුන් ඇත.

- ආණ්ඩුවේ ප්‍රධානීන්
- දෙපාර්තමේන්තු පිළිබඳ වගකීම් නොදරන රජයේ උසස් නිලධාරීහු.
- පාර්ලිමේන්තුවේ යටත් ලේකම්වරු
- පාර්ලිමේන්තුවේ විනයධාරීන්

රාජකීය පවුලේ දේශපාලන නිලධාරීන් මෙහි සාමාජික සංඛ්‍යාව ආසන්න වශයෙන් 60 ට ආසන්න වේ. උක්ත පරිදි එහි ව්‍යුහය දැක්විය හැකිය. මෙම අමාත්‍යය මණ්ඩලය තම කාර්ය කිරීම සඳහා සාමූහික මණ්ඩලයක් ලෙස රැස් නොවේ. ඔවුන්ට සාමූහික කාර්යක් නැත.

**● කැබිනට් මණ්ඩලය යනු,**

අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් කිහිපදෙනෙක් සහ අගමැති ප්‍රධාන කණ්ඩායම ලෙස දැක්විය හැකිය. එය අමාත්‍ය මණ්ඩලයේ අභ්‍යන්තර කණ්ඩායමක් ලෙස දැක්විය හැකිය. එහි සාමාජික පරිස 20 කට ආසන්න අගයක් ගනී. මෙම මණ්ඩලය කාර්යාත්මකව සාමූහික මණ්ඩලයක් ලෙස රැස්වී, කටයුතු සිදුකරයි. කැබිනට් මණ්ඩලය එසේ රැස්වුවද අමාත්‍ය මණ්ඩලය එසේ රැස්වන්නේ නැත.

# කැබිනට් මණ්ඩලය

හැඳින්වීම.

මොකක්ද: බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පිහිටුවා ඇති දේශපාලන විධායකය ක්‍රියාකාරී විධායකය - සත්‍යය විධායකය කැබිනට් මණ්ඩලයයි.

සංයුතිය: අගමැති ප්‍රමුඛ කැබිනට් අමාත්‍යවරුන්ගෙන් කැබිනට් මණ්ඩලය සමන්විත වෙයි. කැබිනට් මණ්ඩලයට අයත් අමාත්‍යවරුන් ලෙස,

- භාණ්ඩාගාරයේ පළමු වන සාමිවරයා
- කවුන්සලයේ සාමිවරයා
- චාන්සලර් සාමිවරයා
- රාජ්‍ය මුද්‍රා සාමිවරයා
- රාජකීය නාවික හමුදාවේ පළමු සාමිවරයා
- වෙළෙඳ මණ්ඩලයේ සභාපතිවරයා
- තැපැල්පති
- විදේශ කාර්යාලය, ඩොමේනියන් කාර්යාලය, යටත් විජිත කාර්යාලය, ගුවන් අමාත්‍යාංශ කාර්යාලය, ස්කොට්ලන්ත කාර්යාලය, යන ඒවායේ ප්‍රධාන ලේකම්වරු
- කෘෂිකර්ම හා ධීවර ඇමති, ප්‍රවාහන, සෞඛ්‍ය හා කම්කරු සම්බන්ධ අමාත්‍යවරු හා විශ්‍රාම කටයුතු පිළිබඳ අමාත්‍යවරයා.

සාමාන්‍යයෙන් කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුන් සංඛ්‍යාව 20 කට ආසන්න අගයක් ගනී.

පත් කිරීම: කැබිනට් මණ්ඩලය සංවිධානය කිරීමේ මූලික කාර්ය වන්නේ අගමැතිවරයා පත් කිරීමයි. ව්‍යවස්ථාදායකයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ බහුතර විශ්වාසය දිනාගෙන ඇති මන්ත්‍රීවරයා අගමැති වරයා වශයෙන් රැජිණ විසින් පත්කරනු ලබයි. අනතුරුව අගමැතිගේ උපදෙස් මත රැජිණ විසින් අමාත්‍යය මණ්ඩලයට අමාත්‍යවරු 60කට ආසන්න ප්‍රමාණයක් පත් කරනු ලබයි. ඉන් අමාත්‍යවරු 20 ක් පමණ වෙනම කැබිනට් මණ්ඩලයක් ලෙස රැස්වී කටයුතු කරයි.

නිලකාලය: කැබිනට් මණ්ඩලයේ ධූරකාලය (නිලකාලය) වසර 5 ක් වශයෙන් සඳහන් වෙයි.

ඉවත් කිරීම: සාමාන්‍යය තත්ත්වය තුළ නිලකාලය වසර 5 ක් වුවද විශේෂිත අවස්ථාවල දී නිල කාලය වසර 5 ට වඩා කෙටි වීමට හෝ දීර්ඝ වීමට හැකිය.

නිදර්ශන : නිලකාලය වසර 5ට වඩා කෙටි වීම, ව්‍යවස්ථාදායකයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ විශ්වාසය ඇති තෙක් කැබිනට් මණ්ඩලය ධූර දරයි. විශ්වාසය බිඳී ගිය මොහොතක විශ්වාස භංග යෝජනාවකින් කැබිනට් මණ්ඩලය ඉවත් කළ හැකිය.

නිදර්ශන : නිල කාලය වසර 5ට වඩා දීර්ඝවීම , සාමාන්‍යය තත්ත්වය තුළ නිලකාලය වසර 5 ක් වුවද යම් විශේෂිත හදිසි අවස්ථාවල නිලකාලය වසර 5ට වඩා දීර්ඝ වේ.

1910 තෝරාගත් කැබිනට් මණ්ඩලය 1918 තෙක් ධූර දැරීම.
1935 තෝරාගත් කැබිනට් මණ්ඩලය 1945 තෙක් ධූර දැරීම.

## ■ කැබිනට් මණ්ඩලයේ කාර්ය හා බලතල ( භූමිකාව)

**1. ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරණය කිරීම.**

කැබිනට් මණ්ඩලය ප්‍රතිපත්ති සාකච්ඡා කරන සහ ඒවා සකස්කරන මණ්ඩලයයි. දේශීය හා විදේශීය වශයෙන් වැදගත් සෑම ප්‍රතිපත්තියක්ම මෙහි දී සංවාදයට ලක්කරයි. ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීරණය කිරීමට අදාළ ප්‍රධාන වශයෙන්,

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය (රාජසන කථාව) සැකසීම.
- අයවැය ලේඛනය සකස් කිරීම.
- ව්‍යවස්ථාදායකය සම්පාධනය කරන නීති පවා මූලිකව තිරණය කිරීම.

**2. නීති ක්‍රියාත්මක කිරීම.**

කැබිනට් මණ්ඩලය නීති ක්‍රියාත්මක කරයි. ව්‍යවස්ථාදායකය විසින් සම්පාධිත නීති ක්‍රියාත්මක කරන්නේ කැබිනට් මණ්ඩලය විසිනි.

**3. පරිපාලන කටයුතු විධිමත් කිරීම.**

රටේ කටයුතු විවිධ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ වලට බෙදා දැක්වීම. දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ අතර සම්බන්ධතාවය පවත්වා ගැනීම. ඒවා අතර ඇතිවන ගැටුම් සමතයකට පත් කරමින් පාලන කටයුතු විධිමත් කිරීම කැබිනට් මණ්ඩලය සතු කාර්ය භාරයකි.

**තවදුරටත්,**

**මුදල් තීරණ කිරීම.**

කෙසේ බදු පැනවිය යුතු ද, ඒවා කෙසේ එකතු කර ගත යුතු ද, එම මුදල් කෙසේ වැය කළ යුතු ද යන්න කැබිනට් මණ්ඩලය තීරණය කරයි. බදු පැනවීම, බදු අයකිරීම, පැරණි බදු සංශෝධනය කිරීම සිදු කරනු ලබන්නේ කැබිනට් මණ්ඩලය යි.

විචාරයකන් ප්‍රකාශ කරන්නේ කැබිනට් මණ්ඩලය විධායක මණ්ඩලයක හැඩතල පමණක් නොව ව්‍යවස්ථාදායක මණ්ඩලයක හැඩතල ද නිරූපණය කරන බවයි. ඊට අදාළව,

- ප්‍රතිපත්ති තීරණය කිරීම.
- නීති ක්‍රියාත්මක කිරීම.
- පරිපාලන කටයුතු ගෙන යාම.
- වැදගත් තනතුරු සඳහා පත්වීම් දීම.
- යුද්ධදය හා සාමය පිළිබඳ තීරණය කිරීම.
- අය වැය පිළියෙල කිරීම.
- ගෞරව නාම ප්‍රධානය කිරීම.

● <u>කැබිනට් මණ්ඩලය බලත්වීමට හේතු</u>

(i) ද්විපක්ෂ ක්‍රමයේ වර්ධනය
(ii) පරිපාලන යුක්තිය පිළිබඳ බලය
(iii) අභියෝජිත ව්‍යවස්ථා සම්පාදනයේ වර්ධනය
(iv) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය
(v) සාමූහික වගකීම් ප්‍රතිපත්තිය වැනි කරුණු බලපා තිබෙයි.

● <u>කැබිනට් ක්‍රමයේ ලක්ෂණ</u>

**1. කැබිනට් මණ්ඩලයක් යනු විශාල කණ්ඩායමක් තුළ ඇතුලත් කුඩා කණ්ඩායමක් වීම.**

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළින් 60 ආසන්න අමාත්‍යවරු ප්‍රමාණයක් තෝරාගන්නා අතර එය අමාත්‍ය මණ්ඩලය වෙයි. එම අමාත්‍ය මණ්ඩලය තුළින් 20 ට ආසන්න අමාත්‍යවරුන් ප්‍රමාණයක් පමණක් කැබිනට් මණ්ඩලයක් ලෙස කටයුතු කරයි.

**2. රජු කැබිනට් මණ්ඩලයට අයත් නොවීම.**

බ්‍රිතාන්‍යය විධායක කටයුතු රජුගේ නාමයෙන් සිදු කෙරෙන මුත් රජු පක්ෂ දේශපාලනයට සහභාගී නොවී මධ්‍යස්ථව සිටී. විශේෂයෙන් රජු කැබිනට් මණ්ඩලයේ සාමාජිකයකු නොවෙයි.

**3. කැබිනට් මණ්ඩලය හා පාර්ලිමේන්තුව අතර ඇති සම්බන්ධය.**

- විශාල කැබිනට් අමාත්‍යවරුන් ප්‍රමාණයක් මහජන මන්ත්‍රී මණ්ඩලය තුළින් තෝරා ගැනීම.

- මුදල් අමාත්‍යවරයා මහජන මන්ත්‍රී මණ්ඩලය තුළින් තෝරා ගැනීම.

- චාන්සලර් සාමිවරයා (අධිකරණ අමාත්‍යවරයා) සාමි මන්ත්‍රී මණ්ඩලයට තෝරා ගැනීම.

- සාමි මන්ත්‍රී මණ්ඩලයෙන් අවම වශයෙන් අමාත්‍යවරු සිව් දෙනෙක් (4) වත් කැබිනට් මණ්ඩලයට තෝරා ගැනීම.

4. **සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය.**

මෙය කැබිනට් මණ්ඩලයේ සහයෝගී තාවයන් සහ සාමූහික භාවයේ ප්‍රතිඵලයකි. කැබිනට් අමාත්‍යවරු පාලන කටයුතු සම්බන්ධයෙන් සාමූහිකව එනම්, කැබිනට් මණ්ඩලයක් වශයෙන් ව්‍යවස්ථාදායකයට වගකිව යුතු බව මින් ප්‍රකාශිතය. මෙම සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය බ්‍රිතාන්‍යය තුළ ඉතා හොඳින් ආරක්ෂාවේ.

**බ්‍රිතාන්‍යය දේශපාලන විද්‍යා සාහිත්‍යමය විවරණයක් තුළ කැබිනට් මණ්ඩලයට අදාළව හමුවන සාහිත්‍යමය ප්‍රකාශන කිහිපයකි.**

**"සමස්ත දේශපාලන යාන්ත්‍රණය භ්‍රමණය වන මාධ්‍ය ඇණය"**
**-සර් ජෝන් මැරියට්-**

**"කැබිනට් මණ්ඩලය දේශපාලන ආරුක්කුවේ මුල්ගල වේ.**
**-ලොල්මේ-**

**"රාජ්‍ය නැමති නෞකාවේ සුක්කානම වේ"**
**-රැම්සේ මූවර්-**

**අමතර කියවීම**

**අගමැතිවරයාගේ ඉතිහාසය.**

අගමැතිවරයා ධූරය බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමයට අහම්බයෙන් සම්බන්ධ වූවකි. I වන ජෝර්ජ් රජුට ඉංග්‍රීසි භාෂාව සම්බන්ධයෙන් පැවති අඩු අවබෝධය නිසා ඔහු කැබිනට් රැස්වීම් වලට නොපැමින ඒ කටයුත්ත "වල්පෝල්" නැමැත්තාට පැවරීය. වල්පෝල් බ්‍රිතාන්‍යය තුළ ප්‍රථම අගමැතිවරයා වන්නේ ය. 1878 වන තුරු අගමැති වරයා සම්බන්ධයෙන් කිසිදු ලියවිල්ලක් බ්‍රිතාන්‍ය දේශපාලන ලිඛිත මූලාශ්‍ර තුළ සටහන්වී නොමැත.

1906 දී ඇතිකරණ ලද පනතකින් අගමැතිවරයාට නිශ්චිත සහ ඉහළ තනතුරක් දෙනු ලැබුවේ "රාජ්‍යය උත්සව වල දී වඩාත් වැදගත් කොට සැලකීමේ අනුපිළිවලක් දීමෙනි" මෙම පනත මගින් රාජ්‍යයේ සිව් වැනි පුරවැසියා බවට අගමැතිවරයා පත්විය.

1917 පනතින් අගමැතිවරයාට නිලවශයෙන් හිමි වතු පිටි භුක්තිවිඳීමේ අවකාශය සැලසින. 1937 කිරීටයේ අමාත්‍යවරු පිළිබඳ පනත. අගමැතිවරයා සම්න්ධයෙන් වඩාත් වැදගත් පනතකි. එමගින් "අගමැති ධූරය නිල වශයෙන් පිළිගනු ලැබීය." ඔහුට වාර්ෂික පවුම් 10,000 ක වැටුපක් ද පිරිනැමීය. වර්තමානයේ ඔහු වාර්ෂික පවුම් 58,650 වැටුපක් ලබයි. 1937 කිරීටයේ අමාත්‍යවරුන් සම්බන්ධ පනතින් අගමැතිධූරය ව්‍යවස්ථානුකූල වශයෙන් පිළිගත්තා පමණක් වන අතර කිසිදු නෛතික බලයක් ලබාදී නොමැත. අගමැතිවරයාගේ සියලු බලතල ව්‍යවස්ථානුකූල සම්ප්‍රදායන් මගින් හිමිව ඇත.

# අගමැතිවරයා

හැඳින්වීම:

කවුද: බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය තුළ ඇති අතිබලවත්ම ධූරය වන්නේ අගමැති ධූරයයි. අගමැතිවරයා **ආණ්ඩුවේ නායකයා** සහ **දේශපාලන විධායකය වන කැබිනට් මණ්ඩලයේ නායකයා** ද වේ.

පත් කිරීම: නාමික විධායක රජින විසින් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ වැඩිම දෙනාගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා අගමැති ධූරයට පත් කරයි. අගමැතිවරයකු පත්කරන ප්‍රධාන අවස්ථා කිහිපයකි.

- මහ මැතිවරණයකට පසුව
- විශ්වාස භංගයෝජනාවකින් අගමැතිවරයකු ඉවත් කළ පසු.
- අගමැතිවරයා ඉල්ලා අස්වීම හෝ මිය යාම.

නිල කාලය: බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අගමැතිවරයාගේ නිල <u>කාලය වසර (5) පහකි.</u>

ඉවත් කිරීම: නිලකාලය, වසර 5ට පූර්ව අගමැතිවරයෙකු ඉවත් කිරීමට නම් පාර්ලිමේන්තුවේ පළමු සභාව වන නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ **විශ්වාසභංග යෝජනාවක්** සම්මත විය යුතු ය.

## ■ <u>අගමැතිවරයාගේ කාර්ය හා බලතල</u>.

අගමැතිවරයාට ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ත්‍රිවිධ ආයතන මත විශාල බලතල ප්‍රමාණයක් සංකේන්ද්‍ර ගතව ඇති බව බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය තුළින් පැහැදිලි වෙයි.

● <u>ව්‍යවස්ථාදායක අංශයේ බලතල - කාර්යයන් (භූමිකාව)</u>

(i) **ව්‍යවස්ථාදායකට පාර්ලිමේන්තුව කැඳවීම, කල්දැමීම, විසුරුවා හැරීම.**

බලතලය ක්‍රියාවට නගන්නේ රජින වුව ද එය අගමැතිගේ අවශ්‍යතාවය හා තීරණ මත සිදු කරයි. එම නිසා එය අගමැතිට අදාළ කාර්යය හා බලතලයක් ලෙස විග්‍රහ කළ හැකිය.

**ශ්‍රීමත් ජෝන් සයිමන්ට අනුව,**

ඉතා ඉක්මනින් මහමැතිවරණයක් පවත් වනවා ද? නැද්ද? එසේ පවත්වනවානම් ඒ පිළිබඳ තීරණ ගන්නේ ද? රට මැතිවරණයට මුහුණ දෙන දිනය තීරණය කරන්නේ ද? අගමැතිවරයා ය.

(ii) **ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව අවශ්‍ය පරිදි මෙහෙයවීමට සහ පාලනය කිරීම.**

(iii) **ව්‍යවස්ථාදායකය තුළින් තමන්ට අවශ්‍ය නීති සම්පාදනය කරවා ගැනීම.**

● විධායක අංශයේ බලතල - කාර්යන් ( භූමිකාව)

(i) **කැබිනට් මණ්ඩලයේ නායකයා වීම.**

(ii) **කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම, මාරුකිරීම සහ ඉවත් කිරීම , ඔවුන්ගේ විෂයන් තීරණය කිරීම.**

කැබිනට් අමාත්‍යවරයකු ලෙස ඕනෑම මන්ත්‍රීවරයෙක් පත් කර ගැනීමේ බලය අගමැතිවරයා සතුවෙයි. නමුත් සම්ප්‍රදායක් ලෙස ඔහු විශේෂ කරුණු වලට සවන් දෙමින් එම කාර්ය සිදු කරයි. ඊට අදාළව පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගේ ඉල්ලීම් සහ අදහස් නිදර්ශන ලෙස දැක්විය හැකිය.

**වුල්ටන් සාමි වරයාට අනුව.**

"අගමැතිවරයා ඔහුගේ අනාගත සහයන් වියහැකි සමීපතම සගයන් කිහිප දෙනෙකුගේ අදහස් විශ්වාසයෙන් යුතුව විමසීමට ඉඩ ඇති අතර කැබිනට් මණ්ඩලයේ තරම තීරණය කිරීම ඔහු සතු කාර්යයකි. තම ආණ්ඩුවේ ස්වරූපය තීරණය කිරීමේ දී එය වඩාත් හොඳින් ක්‍රියාත්මක විය හැක්කේ කෙසේ ද යන්න. ඔහුගේ පෞද්ගලික කැමැත්තට අනුව තීරණය කිරීමට ඔහුට නිදහස තිබේ."

(iii) **කැබිනට් මණ්ඩලය තමන්ට අවශ්‍ය ආකාරයට පාලනය කිරීම.**

අගමැතිවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වන නිසාත්, අමාත්‍යවරුන් ඉවත් කිරීමට ශක්‍යතාව හිමි නිසා ඉවත් කරන බවට තර්ජනය කරමින් සිය කැබිනට් මණ්ඩලය ස්වකීය අභිමතය මත පාලනය කිරීමට හැකි වීම.

නිදර්ශන : 1962 දී මැක්මිලන් නැමති අගමැතිවරයා සිය අමාත්‍යය මණ්ඩලයේ 20 න් 7 ක්ම ඉවත් කිරීම.

**ශ්‍රීමත් රොබට් බීල්ට අනුව,**

"සාමාන්‍ය තත්ත්වය යටතේ අගමැති හා සිය සගයන් අතර මත භේදයක් ඇති වී එය මිත්‍ර ලීලාවෙන් සමාදානයට එළඹීම අපහසු වූ විට එහි ප්‍රතිඵලය විය යුත්තේ එම සගයා ඉවත් වීම මිස අගමැති ඉවත් විම නොවේ"

(iv) **අමාත්‍ය මණ්ඩලයේ සභාපතිවරයා වීම.**

මීට අදාළව කැබිනට් රැස්වීම් කැඳවීම, එහි මුලසුන දැරීම, එම රැස්වීම් වල න්‍යාය පත්‍රය තීරණය කිරීම, සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම දැකිය හැකිය.

(v) **සම්බන්ධීකරණය කරන්නෙකු ලෙස.**

අමාත්‍යාංශවල ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම. ආණ්ඩුව එක් ඒකකයක් ලෙස ක්‍රියාත්මක කරවීමටත්, විවිධ දෙපාර්තමේන්තු ගමන් කළ යුතු දිශානතිය තීරණය කිරීම.

නාමික විධායක රජින සහ දේශපාලන විධායකය වන කැබිනට් මණ්ඩලය අතර සම්බන්ධතාව පැවැත්වීමේ ප්‍රධාන පුරුක වනුයේ අගමැති වරයාය. රජිණ සමඟ සම්බන්දතා පැවැත්විම හරහා රජිණ දරණ අදහස් කැබිනට් මණ්ඩලයටත් කැබිනට් මණ්ඩලයේ සිය සගයන් දරන අදහස් රජිණටත් දැක්වීම හරහා සම්බන්ධීකරණය සිදු කිරීම.

(vi) **රජිණ සමඟ සම්බන්ධතා පැවැත්වීම හා ප්‍රධාන උපදේශකයා වීම.**

රජිණ සහ අගමැතිවරයා අතර ඉතා සමීප දේශපාලනමය සම්බන්ධතාවක් පවතී, රජිණගේ ප්‍රධාන උපදේශකවරයා වන්නේ අගමැති වරයාය.

නිදර්ශන : ගෞරව, නම්බුනාම ප්‍රධානය කළ යුතු අය සම්බන්ධයෙන් රජිණ දැනුවත් කිරීම , ජාතික වශයෙන් වැදගත් කරුණු සම්බන්ධයෙන් රජිණට උපදෙස් දීම,රජිණ බැහැ දැකීමට අගමැතිවරයා විසින් නිතර නිතර බකිම්හැම් මාලිගාවට යයි.

- <u>අධිකරණ අංශයේ බලතල - කාර්යයන් (භූමිකාව)</u>

(i) **උසස් අධිකරණ ආයතනවලට විනිශ්චකාර වරුන් පත් කිරීම තීරණය කිරීම.**

උසස් අධිකරණ ආයතන වලට විනිශ්චකාරවරුන් පත් කිරීම තීරණය කරනු ලබන්නේ අගමැතිවරයා විසිනි. එම තීරණය ක්‍රියාත්මක කිරීම පමණක් රජිණ විසින් සිදු කරයි.

(ii) **වරදකරුවන්ට සමාවදීම තීරණය කිරීම.**

**අගමැතිවරයා සම්බන්ධ බ්‍රිතාන්‍යය දේශපාලන ලියවිලි අතර ඇති ප්‍රකාශන කිහිපයක් සටහන් කිරීම.**

"අගමැතිවරයා කැබිනට්ටුව තුළ කුඩා තරු අතර වැජඹෙන චන්ද්‍රයා බඳුය"
-හාකොට්-

"අගමැතිවරයා සූර්යෙකි ඔහු වටා ග්‍රහලෝක භ්‍රමණය වේ"
-මුන්රෝ-

"සමස්ත ආණ්ඩු යාන්ත්‍රණයම ක්‍රියාත්මක කරන කේන්ද්‍රීය බලය"
-ලැස්කි-

"කැබිනට් මණ්ඩලය නැමති ආරුක්කුවේ මුල් ගල අගමැතිවරයාය."
-ජෝන් මෝර්ලි-

## සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය.

● සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය හැඳින්වීම.

සාමූහික වගකීම් ප්‍රතිපත්තිය යනු කුමක්දැයි සරලව නිර්වචනය කරන්නේ නම්, "පාලන කටයුතු සම්බන්ධයෙන් කැබිනට් ඇමතිවරු (කැබිනට් මණ්ඩලය) පොදුවේ ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුවට වගකිව යුතු බව" ඉන් කියැවෙයි. මෙම සංකල්පය කැබිනට් මණ්ඩලයක් තුළ ඇති දේශපාලන වශයෙන් සුවිශේෂ සහ වැදගත් ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකිය.

● සාමූහික වගකීමේ ප්‍රතිපත්තියේ විකාශනය.

සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය සම්බන්ධ කතිකාවත තුළ දී එහි ඉතිහාසය සහ වර්තමාන තත්ත්වයන් විග්‍රහකර ගැනීම වැදගත් වේ. සාමූහික වගකීමේ ප්‍රතිපත්තියේ මූලාරම්භක ස්වරූපය බවට පත්ව තිබුණේ, රජු විසින් එක් එක් අමාත්‍යවරයාට පවරා දී තිබූ වගකීම් සම්බන්ධයෙන් පෞද්ගලිකව රජුට වගකිව යුතු විමයි. මෙහි ද්විතික විකාශනාත්මක තත්ත්වය ලෙස රජු ස්වකීය ඇමති මඩුල්ල එක් දේශපාලන පක්ෂයකින් තෝරාගැනීමත් සමඟ පොදුවේ අමාත්‍යවරු රජුට වගකිව යුතු යැයි දක්වා විකාශනය විය. 1688 පසු රජුගේ බලය දිය වීමෙන් පාර්ලිමේන්තුව බලවත් වීම සමඟ කැබිනට් මණ්ඩලය පොදුවේ ස්වකීය පාලන කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට ව කිව යුතුය යන්න දක්වා සාමූහික වගකීමේ සංකල්පය වර්ධනය විය.

● කැබිනට් මණ්ඩලයේ සාමූහිකත්වය ආරක්ෂා කර ගන්නා ආකාරය.

රාජ්‍ය පාලන කටයුතු සිදුකරන්නේ කැබිනට් මණ්ඩලයේ තීරණ හා ප්‍රතිපත්ති වලට අනුවයි. මෙම කැබිනට් මණ්ඩල තීරණ හා ප්‍රතිපත්ති සකස් කිරීමේ දී කැබිනට් අමාත්‍යවරුන්ට ස්වකීය පෞද්ගලික මතවාද, තර්ක විතර්ක, සංවාද, විවේචන ඉදිරිපත් කළ හැකිය. නමුත් අවසානයේදී බහුතරයේ අනුමැතිය මත තීරණයකට එළඹී පසු එයට විරුද්ධ විය නොහැකිය.

● සාමූහික වගකීම් සම්බන්ධ සාහිත්‍යමය ප්‍රකාශන

**"මහත්වරුනි අප කුමක් කීවත් අවසානයේ එක් තීරණයක වීමට වගබලා ගත යුතුය."**
**-මෙල්බෝන් සාමිවරයා-**

**"අප කරන දේ වැදගත් නොවන අතර අප සියලු දෙනම එක හඬින් කතා කිරීම වැදගත් වේ."**
**-මෙල්බෝන් සාමිවරයා-**

● <u>සාමූහික ත්වයට අවනත නොවන අමාත්‍යවරුන්ට සිදුවන දේ</u>

අමාත්‍යවරයෙකු අමාත්‍යවරුන් විසින් පොදුවේ ගත් තීරණයකට එකඟ නොවන්නේ නම් ඔහු කැබිනට් මණ්ඩලයෙන් ඉවත් විය යුතු ය. නැතිනම් සාමූහිකත්වය බිඳ දැමූ අමාත්‍යවරයෙකු ලෙස සලකා අගමැතිවරයා විසින් එම අමාත්‍යවරයා ඉවත් කර දමයි. කැබිනට් මණ්ඩලයේ සාමූහික භාවය ආරක්ෂා කරන්නා අගමැතිවරයාය. කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලා අස්වූ අමාත්‍යවරුන්ට අදාළ **නිදර්ශන.**

- පීල් ජනරාල් වරයා සහ තවත් අමාත්‍යවරු තිදෙනෙක් ඉල්ලා අස්වීම, මෙයට හේතු වී ඇත්තේ ඩිස්රාල්ස් (Disral)ප්‍රතිසංස්කරණ වලට මොවුන් එකඟ නොවීමයි.
- 1914 දී මෝර්ලි සාමිවරයා සහ බර්නිස් ඉල්ලා අස්වීම, මෙයට හේතු වූයේ යුද්ධ කිරීමේ තීරණයට ඔවුන් එකඟ නොවීමයි.

කැබිනට් මණ්ඩලය තුළ <u>පොදු එකඟතාවයන් ලබා ගැනීමට නොහැකි වූ ප්‍රතිපත්ති පිළිබඳවද</u> බ්‍රිතාන්‍යය දේශපාලන අතීතය තුළ සඳහන් වෙයි. එවැනි තත්ත්වයන් තුළ කැබිනට් අමාත්‍යවරුන්ට එම ප්‍රතිපත්ති සම්බන්ධයෙන්පෞද්ගලිකව ඡන්දය ලබාදීමට අවස්ථාව ලබා දී ඇත.

නිදර්ශනඃ 1983 කොන්සවේට ආණ්ඩුව ගෙන ආ මරණීය දණ්ඩනය පැනවීමේ ප්‍රතිපත්තිය.

කැබිනට් අමාත්‍යවරු පෞද්ගලිකව තමන්ගේ අමාත්‍යංශ සම්බන්ධයෙන්ද පොදුවේ සියලු අමාත්‍යංශ සම්බන්ධයෙන් ද ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටියි. එක් අමාත්‍යවරයෙකුගේ දුර්වලතාවයක් මත විශ්වාස භංග යෝජනවාක් ඉදිරිපත් වුවහොත් එය එම එක් අමාත්‍යවරයාට පමණක් එල්ල වූ විශ්වාසභංග යෝජනවාක් නොවන අතර සමස්ත කැබිනට් මණ්ඩලයටම එල්ල වූවකි. එම නිසා මෙම <u>කැබිනට් අමාත්‍යවරුන් තුළ එකිනෙකා විස්වාස කරගැනීම් නැත</u>. <u>විනය ගරුක භාවය, එක්සත් භාවය රහස්‍ය භාවය</u> වැනි ලක්ෂණ හඳුනාගත හැකිය.

> **"අමාත්‍යවරයෙකු තමන්ගේ ක්‍රියාවක් නිසා හෝ තමා වගකිව යුතු යටත් නිළධාරියකුගේ ක්‍රියාවක් නිසා හෝ අසීරු තත්ත්වයට පත් වුවහොත් ඔහුගේ සගයින් ඔහු ගිලී මිය යන තෙක් හෝ පිහිනා ගොඩ එනතෙක් ඇත ඉවුරට වී බලා නොසිටිනු ඇත. ඔවුන් ද දියට පැන ඔහු දිය යටට තල්ලු කිරීම හෝ ඔහු තමන්ගේ බෝට්ටුවට ගෙන ඔහුගේ ඉරණම තමන්ගේ ඉරණම ලෙස බාර ගනී"**
>
> **-ඔග් නැමති විචාරකයා-**

□ <u>සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය තුළ හඳුකාගත හැකි වැදගත්කම් (වාසි)</u>.

1. විධායකයට හිතකර වීම.
2. රටට හිතකර වීම.
3. පරිපාලන බිඳවැටීම් ඇති නොවීම.

□ <u>සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය තුළ හඳුනාගත හැකි දුර්වලතා (අවාසි)</u>

1. එක් අතකින් මෙය විධායකයට අහිතකර සංකල්පයක් ලෙස ද විග්‍රහකළ හැකිය.

# අධිකරණය

# බ්‍රිතාන්‍යය අධිකරණය.

<u>හැඳින්වීම.</u>

එංගලන්ත අධිකරණ පද්ධතිය ඉතාම පැරණි වුවත් වර්තමාන අධිකරණ ආයතන ව්‍යූහය නූතන ස්වරූපයක් ගනී. නම්‍ය, අලිඛිත ආණ්ඩුක්‍රමයක් ක්‍රියාත්මක බ්‍රිතාන්‍යය තුළ අධිකරණ <u>පද්ධතිය සංවිධාන ගතවී තිබෙන්නේ</u>,

- **අධිකරණය සම්බන්ධ ආණ්ඩුක්‍රම සම්ප්‍රදායන්,**
- **අධිකරණ තීන්දු**
- **අධිකරණය හා සම්බන්ධ පාර්ලිමේන්තු පනත්,** මගිනි.

අධිකරණය හා සම්බන්ද පාර්ලිමේන්තු පනත් විමර්ශනය කරන කල්හි බ්5තාන්‍යය දේහපාලනමය ලේඛන තුළ ඇති,

| | | |
|---|---|---|
| 1873 | - | **අධිකරණ පනත** |
| 1925 | - | **ශ්‍රේෂ්ඨාධිකරණ ඒකාබන්ධ පනත.** |
| 1911 | - | **උසාවි පනත** |

මේ පනත් අතරින් <u>1873 අධිකරණ පනතට වැඩි වැදගත් භාවයක් හිමි වෙයි. එයට වැදගත් භාවයක් හිමිවන්නේ, පැරණි අධිකරණ පිළිවෙත වෙනස් කර අධිකරණ පිළිවෙල නිශ්චය කිරීම නිසාය</u>.

<u>අධිකරණ ව්‍යූහය.</u>

බ්‍රිතාන්‍යය අධිකරණ ව්‍යූහය තුළ ප්‍රධාන ස්ථර 2 ක් හඳුනාගත හැකිය. උසස් අධිකරණ ආයතන සහ පහළ අධිකරණ ආයතව වශයෙනි.

**අධිකරණ ව්‍යූහය ප්‍රධාන ස්ථර 2 කි.**

**උසස් අධිකරණ ආයතන**

- සාමි මන්ත්‍රී මණ්ඩලය
- ප්‍රිවි කවුන්සලයේ අධිකරණ කාරක සභාව
- අභියාචනාධිකරණය
- මධ්‍යම අපරාධ උසාවිය
- සාක්ෂි උසාවිය
- ශ්‍රේෂ්ඨාධිකරණය

**පහළ අධිකරණ ආයතන**

- කෝරළ උසාවි
- කොරනල් උසාවි
- පරීක්ෂක මහේස්ත්‍රාත් උසාවි
- සුළුවාර උසාවි
- ත්‍රෛමාසික උසාවි

ඉහත අධිකරණ වර්ගීකරණයට අමතරව අධිකරණ ධූරාවලිය මතද වර්ගීකරණයක් වෙයි.

**අධිකරණ ධූරාවලිය**

- සිවිල් උසාවි ධූරාවලිය
  - වසම් උසාවි ↓
  - මහ අධිකරණය ↓
  - අභියාචනාධිකරණය ↓
  - සාමි මන්ත්‍රී මණ්ඩලය
- අපරාධ උසාවි ධූරාවලිය
  - ලඝු උසාවි ↓
  - ත්‍රෛමාසික උසාවි ↓
  - අපරාධ උසාවි ↓
  - අපරාධ අභියාචනාධිකරණය ↓
  - සාමි මන්ත්‍රී මණ්ඩලය

<u>සාමි මන්ත්‍රී මණ්ඩලය.</u>

හැඳින්වීම සාමි මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනා අධිකරණ කටයුතු සඳහා සම්බන්ධ නොවෙති. සම්බන්ධ වන්නේ නීති සාමි වරු 21 ක් දෙනා සහ චාන්සලර් සාමිවරයා පමණි. නමුත් යම් නෛතික කාර්යභාරයක් ඉෂ්ඨ කිරීම සඳහා අවශ්‍ය වන්නේ අධිකරණ අමාත්‍යවරයා වන චාන්සලර් සාමි ඇතුළ තවත් සාමිවරු 3 ත් 5 ත් අතර සංඛ්‍යාවක් පමණි.

කාර්යයන් සාමි මන්ත්‍රී මණ්ඩලය උසස්ම අධිකරණ ආයතනය වේ. එයට අයත් භූමිකාව (කාර්ය) ලෙස, සිවිල් හා අපරාධ නඩු සම්බන්ධයෙන් අවසාන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම, පහළ අධිකරණවලින් එන අභියාචනා සලකා බැලීම දැක්විය හැකිය.

<u>ප්‍රිවි කවුන්සිලයේ අධිකරණ කාරක සභාව.</u>

හැඳින්වීම අධිකරණ අමාත්‍යවරයා වන චාන්සලර් සාමි වරයාත්, නීති සාමි වරුන් 21 දෙනාත්, ප්‍රිවි කවුන්සලයේ සභාපති සාමි වරයාත්, විදේශවල ඉහළ උසාවි වලට සම්බන්ධ වූ උසස් පුද්ගලයන් ගෙන් සහ ජූරි සභිකයන් 30 දෙනෙකුගෙන් මෙය සමන්විත වෙයි. ප්‍රිවි කවුන්සලය අධිකරණයකට වඩා කිරීටය නෛතික කටයුතු සම්බන්ධයෙන් සහයවීමට පිහිටුවා ඇති ආයතනයක් ලෙස නිර්වචනය කිරීම යෝග්‍ය වේ.

කාර්යයන් ප්‍රිවි කවුන්සලය අධිකරණ කාරක සභාවේ භූමිකාව (කාර්ය) ලෙස, යටත් විජිත, ඩොමීනියන් රාජ්‍යයන් හි පොදු රාජ්‍යය මණ්ඩලීය සාමාජිකත්වය ඇති රටවල පමණක් නොව බ්‍රිතාන්‍යය තුළ ආගමික අධිකරණ වලින් යොමුවන නඩු සඳහා අවසාන අභියාචනාධිකරණය ලෙස කටයුතු කිරීම ලෙස දැක්විය හැකිය.

**<u>අභියාචනාධිකරණය</u>.**

හැඳින්වීම නඩු ලැයිස්තු සංවිධායක සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ කණිෂ්ට විනිසුරුවන් 17 කින් මෙය සමන්විත වේ. මේ අධිකරණය ලන්ඩන් නුවර රැස්වෙයි.

කාර්යයන් අභියාචනාධිකරණයේ භූමිකාව ලෙස වසම් උසාවි වලින් එන අභියාචනා පිළිගැනීම දක්වා ඇත.

<u>මධ්‍යම අපරාධ උසාවි</u>.

මෙහි ස්ථරයන් කිහිපයක් පවතී. සාමදාන විනිශ්චයකරුවන්, වැටුප් ලබන මහේස්ත්‍රාත්වරුන් වැනි සාමාජිකයන්ගෙන් සැඳුම් ලද්දකි. මෙහි භූමිකාව අපරාධ නඩු පිළිබඳ විමසීම වේ.

<u>ශ්‍රේෂ්ඨාධිකරණය</u>.

මෙහි ව්‍යුහය තරමක් සංකීර්ණ වෙයි.




**ශ්‍රේෂ්ඨාධිකරණ අංශය.**

නීති සාම්වරයා මුලසුන දරණ අතර තවත් නීති සාම්වරු 17 කින් සමන්විත වෙයි. මෙහි භූමිකාව ලෙස, පොදු නීති පිළිබඳ විභාග සහ මහඅධිකරණ නඩු විභාග දැක්විය හැකිය.

නිදර්ශනඃ මැතිවරණ පෙත්සම්, ණය පිළිබඳව, අලාභ හානි පිළිබඳව නඩු.

**චාන්සරි අංශය.**

මුලසුන චාන්සලර් සාම්වරයා වන අතර තවත් විනිසුරුවන් 8 සමන්විත වෙයි. මෙහි භූමිකාව වන්නේ, නීති ප්‍රතිකර්ම ප්‍රමාණවත් නොවන නඩු පිළිබඳ විමසීමයි.

නිදර්ශනඃ සමාගම් නඩු, ආදායම් බදු පිළිබඳ නඩු, බංකොලොත් වීම් පිළිබඳ නඩු.

**පරිවාස දික්කසාද අංශය.**

මුලසුන සභාපතිවරයකු දරණ අතර තවත් විනිසුරුවන් 10 සමන්විත වෙයි. මෙහි භූමිකාව වන්නේ, අවසාන කැමති පත්‍ර, විවාහක, දික්කසාද, භාර්යාවන් සහ දුබලයන් පිළිබඳ නඩු විමසීමයි.

කොරනල් උසාවි.

මෙම උසාවිය සෘජුවේම අතීතයෙන් උරුම වුවකි. අතීතයේ හදිසි මරණ පරීක්ෂක 'ක්‍රවුනර්' නමින් හැඳින්විය. ඔහු නීතිමය සහ වෛද්‍ය සුදුසුකම් ලත් අයෙකි. යම් මරණයක් ස්වාභාවිකව සිදු වී නැතැයි ඔහුට හැගේ නම් මරණ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු තීරණය කරයි. තවදුරටත් සියදිවි නසාගැනීම් සම්බන්ධ නඩු ගිනිතබාගැනීම් පිළිබඳ නඩු මොහුගේ මූලිකත්වයෙන් පවත්වයි.

● අධිකරණයේ ස්වාධීනත්වය

අධිකරණයේ ස්වාධීනත්වය යනුවෙන් සරලව නිර්වචනය කරනු ලබන්නේ ව්‍යවස්ථාධායකයේ සහ විධායකයේ බලපෑමකින් තොරව අධිකරණයට ස්වකීය භූමිකාව රඟ දැක්වීමට ඇති අවකාශය වේ. රටක කටයුතු සාධාරණව ඉටු වීම කෙරෙහි අධිකරණයේ ස්වාධීනත්වය බලපායි. අධිකරණයේ ස්වාධීනත්වය රැකීමට ක්‍රියාමාර්ග ගනු ලබන අංශයන් කිහිපයකි.

- **අධිකරණයට කරණු ලබන පත් කිරීම්**
- **ඉවත් කිරීම්**
- **සේවාකාලය**
- වැටුප්

බ්‍රිතාන්‍යය තුළ ද අධිකරණ ස්වාධීනත්වය රැකීම සඳහා ඉහත ක්‍රියාමාර්ග ගෙන තිබෙයි.

**අධිකරණයට කරනු ලබන පත් කිරීම්,** o

උසස් අධිකරණ ආයතනවලට විනිසුරුවරුන් අගමැතිගේ මෙහෙය වීම මත රැජිණ විසින් පත් කරයි. නමුත් 'ජ්‍යෙෂ්ඨත්වය' මත විනිසුරුවන් පත්කරන සම්ප්‍රදායක් බ්‍රිතාන්‍යය තුළ වේ. එම නිසා එම පත්කිරීම් තුළ යම් ස්වාධීනත්වයක් අපේක්ෂා කළ හැකිය.

**සේවා කාලය.** o

බ්‍රිතාන්‍ය උසස් අධිකරණ ආයතනයක විනිසුරුවෙකුගේ විශ්‍රාමික වයස අවු. 70 කි.

**ඉවත් කිරීම** o

විනිසුරුවරයෙකු ඉවත්කිරීම සඳහා ව්‍යවස්ථාදායකයේ මණ්ඩල දෙක සම්මත කළ යෝජනාවකට නාමික විධායකය රැජින අනුමැතිය දිය යුතුය.

වැටුප්. o

විනිසුරුවරුන්ගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කළ අතර, ඒකාබද්ධ අරමුදලින් ගෙවයි. සේවා කාලය තුළ වැටුප් අඩු කළ නොහැකි බවට කොන්දේසි යොදා තිබුණි.

තවදුරටත් ,

- අධිකරණ අමාත්‍යවරයා චාන්සලර් සාමිවරයා පාර්ලිමේන්තුවේ දෙවන සභාව වන සාමි මන්ත්‍රී මණ්ඩලය තුළින් පත් කිරීම.

- 'නීතියේ ආධිපත්‍යය' සංකල්පය ඉතා ඉහළින් පැවතීම. පාලිතයා මෙන්ම පාලකයා ද නීතිය ඉදිරියේ එක සමාන යැයි මින් ප්‍රකාශිතය.

- පරිපාලන අධිකරණ නමින් විශේෂිත අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක නොවීම.

- <u>බ්‍රිතාන්‍යය අධිකරණ පද්ධතියේ ලක්ෂණ</u>

(i) <u>අධිකරණ සංවිධානය පිළිබඳ ඒකීය ස්වරූපයක් නොතිබීමයි.</u>

සමස්ත බ්‍රිතාන්‍යයටම පොදුවේ ක්‍රියාත්මක වන ඒකීය අධිකරණ පද්ධතියක් නොමැතිවීම.

නිදර්ශන : එංගලන්තයේ සහ වේල්සයේ අධිකරණ ආයතන වල ස්වරූපයෙන් ස්කොට් ලන්තයේ අධිකරණ ආයතන වෙනස් වීම. උතුරු අයර් ලන්තයේ අධිකරණ ආයතන ද සාපේක්ෂ වෙනස් හැඩතල දරයි.

(ii) <u>අධිකරණ සමාලෝචන (ප්‍රතිනිරීක්ෂණ) බලය නොමැතිවීම.</u>

එංගලන්තයේ කිසිදු අධිකරණ ආයතනයකට අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය නොමැත. පාර්ලිමේන්තුව සකස් කරන නීති වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීමට කිසිදු අධිකරණයකට බලය නැත.

(iii) <u>යුක්තිය ඉහළ මට්ටමින් තිබීම.</u>

යුක්තිය සහ ගුණාත්මක භාවය ඉතා ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම, නඩු ඉතා ඉක්මනින් විසඳීම, සාක්ෂි කරුවන්ට කරදර බාධා නොමැති වීම. විනිශ්චකරුවන්ට ගරු නම්බු ප්‍රධානය කිරීම යන ඉහළ වැටුප් පරිමාන මගින් ඔවුන්ගේ අපක්ෂපාතී ශ්‍රමය ලබාගැනීම.

(iv) <u>ජූරි ක්‍රමය</u>.

ජූරි ක්‍රමයේ ප්‍රභවය සම්බන්ධ හිමිකම එංගලන්තය සතුය. එංගලන්ත අධිකරණ ඉදිරියේ දී 'චූදිතයාට' නඩුව ජූරියක් ඉදිරියේ විමර්ශනය කරන ලෙස ඉල්ලා සිටිය හැකිය.

(v) <u>මිනිස් නිදහස පිළිබඳ හිමිකරුවා.</u>

(vi) <u>පරිපාලනය සඳහා වෙනම උසාවි නොමැති වීම.</u>

# පක්ෂ ක්‍රමය

# බ්‍රිතාන්‍යය පක්ෂ ක්‍රමය.

- <u>බ්‍රිතාන්‍යය පක්ෂ ක්‍රමයේ ඉතිහාසය හා විකාශනය</u>

17 වැනි සියවසට පෙර බ්‍රිතාන්‍යය තුළ දේශපාලන පක්ෂ නොමැත. නමුත් රජු කේන්ද්‍ර කොට ගෙන බෙදී ගිය ප්‍රධාන සමාජ කණ්ඩායම් දෙකක් විය. **කැවලියර් සහ රවුන්හෙඩ්** ලෙස හඳුනාගත හැකිය.

**කැවලියර්** (Kavaliyer) - රජුගේ හා පල්ලියේ අභිමතානුසාරී බලයට පක්ෂව ක්‍රියා කළ පිරිසකි.

**රවුන්ඩ්හෙඩ්** (Roundheads) - රජුගේ හා පල්ලියේ අභිමතානුසාරී බලයට විරුද්ධව ක්‍රියා කළ පිරිසකි.

රවුන්ඩ්හෙඩ් සහ කැවලියර් වරුන් නූතන දේශපාලන පක්ෂවල හැඩතල ඇති කණ්ඩායම් දෙකක් නොවේ. ඔවුන් හුදු සමාජ කණ්ඩායම් දෙකක් පමණි. 17 වැනි සියවස අගභාය වන විට මෙම කණ්ඩායම් දෙක විකාශනය විය. ඒ

කැවලියර්වරු ⟶ **විග්වරු**

රවුන්හොඩ්වරු ⟶ **ටොරීවරු**

**ටෝරි වරුන්** <u>ස්ථාපිත වූ එංගලන්ත සභාව</u> සමඟ සබඳකම් පවත්වමින් කිරීටයේ අභිමතානුසාරී බලතල වලට පක්ෂව කටයුතු කළ අතර ඔවුහු <u>සමාජයේ ඉහළ පංතියේ අපේක්ෂාවන්</u> නියෝජනය කළහ.

**විග්වරුන්** ස්ථාපිත වූ එංගලන්ත සභාවට විරුද්ධ වූ <u>ඩිසෙන්ටර්ස්</u> සමඟ සම්බන්ධ වූහ. කිරීටයේ අභිමතානුසාරී බලතල අඩු කිරීම වෙනුවෙන් ක්‍රියාකළ අතර සමාජයේ දිළිඳු පංතියේ අපේක්ෂාවන් නියෝජනය කළේ ය. **<u>ටෝරිවරුන්ගෙන් සහ විග් වරුන්ගෙන් මහා බ්‍රිතාන්‍යය තුළ ප්‍රථම දේශපාලන පක්ෂ වල හැඩතල නිරූපනය විය. ඒ අනුව ඓතිහාසික මහා බ්‍රිතාන්‍යය තුළ ටෝරි සහ විග් ප්‍රථම දේශපාලන පක්ෂ ලෙස ඉතිහාසයට එකතු විය</u>.**

<u>1832 ප්‍රතිසංස්කරණ පනත සම්මත කළ පසු විග්වරුන්ගේ ස්වකීය නාමය 'ලිබරල්' ලෙස ද ටෝරිවරු 'කොන්සවේටිව්' ලෙස ද සංශෝධනය කළේය.</u>

විග්වරුන් ⟶ ලිබරල් පක්ෂය

ටෝරිවරුන් ⟶ කොන්සවේටිව් පක්ෂය

කාර්මීකරණය මුල්භාගයේ එංගලන්තය තුළ වෘත්තිය සමිති ඇති වී 19 වැනි සියවස තුළ එය සීඝ්‍රයෙන් වර්ධනය විය. මෙම අවධිය තුළ වෘත්තිය සමිති පදනම් කොට ගෙන නව දේශපාලන පක්ෂයක් උත්පාද වෙයි. ඒ **'ලේබර් පක්ෂයයි'.** මෙම ලේබර් පක්ෂයේ උද්පාදයත් සමඟ ලිබරල් පක්ෂය ක්‍රමයෙන් දියවී යන ආකාරය හඳුනාගත හැකිය. ඒ අනුව නූතනය තුළ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් වේ.

(i) කොන්සවේටිව් පක්ෂය (Conservertive Party)
(ii) ලේබර් පක්ෂය (Labour Party)

- **බ්‍රිතාන්‍යය පක්ෂ ක්‍රමය ද්වී පක්ෂ ක්‍රමයකි.**

බ්‍රිතාන්‍යය පක්ෂ ක්‍රමයට අදාළ මෙම සාකච්ඡාව තුළ මීළඟ අදියර බ්‍රිතාන්‍යය පක්ෂ ක්‍රමය ද්විපක්ෂ ක්‍රමයක් ලෙස විග්‍රහකිරීමට හැකිය. ද්විපක්ෂ ක්‍රමයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න අවධානය යොමු කළ යුතු ය. ආණ්ඩු බලය දිනා ගැනීමට තරම් ශක්තියක් ඇති පක්ෂ දෙකක් පමණක් පැවතීම ඉන් අදහස් කරනවා මිස පක්ෂ දෙකක් පමණක් පැවතිම යැයි එහි අර්ථය පටුකර නොගත යුතු ය. ද්වි පක්ෂ ක්‍රමයට අදාළ එම පදනම සපයන පක්ෂ දෙක වන්නේ කොන්සවේටිව් සහ ලේබර් පක්ෂයයි. එම පක්ෂ දෙක හැරුණු කළ

- ලිබරල් පක්ෂය
- කොමියුනිස්ට් පක්ෂය
- සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
- ස්කොට්ලන්ත ජාතික පක්ෂය

යනුවෙන් පක්ෂ කිහිපයක් හඳුනාගත හැකි මුත් මේවා ආණ්ඩුබලය දිනා ගැනීමට තරම් ශක්තිමත් දේශපාලන පක්ෂ නොවේ. එම නිසා බ්‍රිතාන්‍යය පක්ෂ ක්‍රමය ද්වි පක්ෂ ක්‍රමයක් ලෙස හඳුන්වයි.

**ද්විපක්ෂ ක්‍රමය පැවතීම කෙරෙහි බලපාන සාධක.**

- බ්‍රිතාන්‍යය තුළ පවතින පංති විෂමතාවය.

  එංගලන්තීය රාජ්‍යය තුළ ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය සීමා තුළ පංති විෂම භාවය හඳුනාගත හැකිය. ඊට අදාළව එම පංති නියෝජනය කරමින් ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකෙහිම සාමාජිකයන් රාශිගත වීම ද්විපක්ෂ ක්‍රමය පැවතීමට එක් හේතුවකි. ධනපතියන් කොන්සවේටිව් පක්ෂය වටා ද, කම්කරුවන් සහ නිර්ධන පාංතිකයන් ලේබර් පක්ෂය වටා ද රාශිගත වීම.

- මැතිවරණ ක්‍රමය (නියෝජන ක්‍රමය)

  බ්‍රිතාන්‍යය තුළ සරල බහුතර නියෝජන ක්‍රමය ක්‍රියාත්මක වන අතර ප්‍රාදේශීය පදනම මත බෙදාවෙන් කරන ලද මැතිවරණ කොට්ඨාශ වලින් නියෝජිතයන් තෝරා ගනීත මෙහේදී ප්‍රධාන දේශපාලන පක්ෂ වලට පමණක් ආසන හිමිවේ. ඒ මත ද්විපක්ෂ ක්‍රමය ස්ථාවර ය.

- සාම්ප්‍රදායිකත්වය තුළ පක්ෂ නිර්මාණය වූ ආකාරය.

අහම්බෙන් හෝ බ්‍රිතාන්‍යය තුළ මූලාරම්භක තත්ත්වය තුළ දේශපාලන පක්ෂ දෙකක් පමණක් උත්පාද වන අතර දීර්ඝ කාලයක් එම පක්ෂ දෙක පැවතීම සහ එය සම්ප්‍රදායක් බවට පත්ව තිබීම. වැනි සාධක කිහිපයක් ද්විපක්ෂ ක්‍රමය පැවතීම කෙරෙහි ඍජුව බලපා ඇති බව මහා බ්‍රිතාන්‍යය දේශපාලන ඉතිහාසය තුළින් පැහැදිලිය.

ද්වි පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයකට පරිවර්තනයවීමේ අවකාශය.

විචාරක, මතවාද අනුව නූතනය තුළ මෙය ද්වීපක්ෂ ක්‍රමයට යම් බාධාකාරීමය ස්වභාවයක් උත්පාද වෙමින් පවතී. විචාරකයන් පෙන්වා දෙන්නේ බ්‍රිතාන්‍යය පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයට පරිවර්ථනය වීමේ පළමු අදියර ආරම්භ වී ඇති බවයි.

නිදර්ශන : නූතය තුළ සහාග ආණ්ඩු ඇති වීමේ ප්‍රවනතාවයක් එංගලන්තය තුළ දෘශ්‍යමාන වීම.

2010 මැතිවරණයේ දී ප්‍රධාන පක්ෂ දෙකටම කුඩා පක්ෂවල සහය නොමැතිව ආණ්ඩු පිහිටුවීමට නොහැකි විය. කොන්සවේටිව් සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී යන පක්ෂ සහාග ගත වී ආණ්ඩුව පිහිටු වීම.

බ්‍රිතාන්‍ය දේශපාලන පක්ෂ සංවිධානය ගතවී ඇති ආකාරය.

කොන්සවේටිව් පක්ෂය, ධනවත් රදළ පැලැන්තියේ පක්ෂයකි, විශ්වවිද්‍යාල වල උපාධිධාරීන්, මධ්‍යම පාංතිකයන්, වැඩකරන පංතියේ ජාති හිතෛෂීහු අසහනයට පත් වූ සේවකයන්, උසස් පුහුණු ශ්‍රමිකයන් වැනි සාමාජිකත්වය කොන්සවේටිව් පක්ෂය වටා රාශිගත වී ඇත. භූගෝලීය වශයෙන් එංගලන්තයේ දකුණු කොටස කොන්සවේටිව් නැඹුරුවක් දක්වයි. කොන්සවේටිව් පක්ෂයේ ප්‍රතිපත්ති, එඩ්මන් බර්ග්, ඩේවිඩ් හියුම්, ඇඩම් ස්මිත් යන දර්ශනවාදීන්ගේ මතවාද මතින් පෝෂණය විය.

ලේබර් පක්ෂය, 1906 දී මෙම පක්ෂය ආරම්භ විය. කම්කරුවන් පමණක් නොව, ගුරුවරු, ව්‍යාපාරිකයන්, පුවත් පත් කලාවේදීන්, හමුදානිලධාරීන්, ඉංජිනේරුවන්, බිෂොප්වරු, කෘෂිකාර්මිකයන් වැනි සාමාජිකයන් මෙම පක්ෂය වටා රාශි ගත වී ඇත. ලේබර් පක්ෂයේ ප්‍රතිපත්ති වෘත්තිය සමිතිවාදය සහ සමාජවාදය යන මතවාදවලින් පෝෂණය විය.

මෙම මූලික පක්ෂ දෙකේ ප්‍රතිපත්ති එකිනෙකට විරුද්ධ වන ආකාරය හඳුනාගත හැකිය.

කොන්සවේටිව් වාදීන් (කොන්සවේටිව් පක්ෂය) රාජ්‍යත්වය පල්ලිය සහ දේපල යන ආයතන වලට සහය දැක්වීම. රජුගේ බලය අඩු කිරීමට එයට අවශ්‍ය නැත. ජනතාව තම රජුට පක්ෂපාතී විය යුතු යැයි අවධාරණය කරයි. රජ පවුල පිළිබඳ වර්ණනා කරයි. සියලුම පුරවැසියන් පල්ලියේ සාමාජිකයන් විය යුතු බව විශ්වාස කරයි. බ්‍රිතාන්‍යය අධිරාජ්‍ය වාදය ස්ථාවර කිරීමට නොකඩවා පවත්වාගෙන යාමට උත්සාහ දරයි.

ලේබර් වාදීන් (ලේබර්පක්‍ෂය), රාජ්‍යයත්වය, පල්ලිය සම්බන්ධයෙන් එතරම් උනන්දුවක් නොදක්වයි. විශේෂයෙන් අධිරාජ්‍යවාදයට ඉතා තදින් විරුද්ධ වේ. නිරායුධකරණයට දැඩි කැමැත්තක් දක්වයි. අන්තර්ජාතික සාමය සහයෝගීතාවය අගය කරයි. ධනවාදය අහෝසි කිරීමට යෝජනා කිරීම, ඉඩම් ප්‍රාග්ධනය ජාතිය සතු විය යුතුයැයි විශ්වාස කිරීම, ධනය වඩාත් සමානව බෙදී යා යුතු බව විශ්වාස කිරීම සියලුම කර්මාන්ත ජනසතු කළ යුතු යැයි විශ්වාස කිරීම, බදු අය කිරීම ක්‍රමානුකූල විය යුතු යැයි විශ්වාස කිරීම.

ඉහත ආකාරයට කොන්සවේටිව් සහ ලේබර් පක්‍ෂ දෙකේ පක්‍ෂ සංවිධානය සහ එහි ප්‍රතිපත්තිය කරුණු ම්බන්ධයෙන් විග්‍රහකළ හැකිය. වැඩි දුර අධ්‍යයනය සඳහා සුළු පක්‍ෂ සම්බන්ධයෙන් ද සංක්‍ෂිප්ත සටහනක දැක්වීම.

**ලිබරල් පක්‍ෂය,**

ජොන් ලෝග් ගේ න්‍යායික කරුණු මත නිර්මාණය වී තිබීම. ආගමික නිදහස සමග ඡන්ද බලය වෙනුවෙන් පෙනී සිටීම. රාජ්‍ය නිර්බාද වාදය නිදහස් වෙළෙඳාම සම්බන්ධයෙන් පෙනී සිටීම.

**කොමියුනිස්ට් පක්‍ෂය,**

ධනවාදී පාලනය අවසන් කර කොමියුනිස්ට් පාලනයක් ඇති කළ යුතු යැයි විශ්වාස කරන කුඩා මාක්ස්වාදී කණ්ඩායම් වලින් යුතු පක්‍ෂයකි. නමුත් එංගලන්තය තුළ මෙම පක්‍ෂය වර්ධනයට අවකාශයක් නැත.

**සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්‍ෂය,**

1981 දී මෙය ආරම්භ විය. ලේබර් පක්‍ෂයෙන් බිඳී ආ සාමාජිකයන්ගෙන් නිර්මාණය වූ පක්‍ෂයකි. විවෘත්ත ආර්ථික, යුරෝපීය පොදු වෙළෙඳ පොලේ සාමාජිකත්වය යන කරුණු පිළිබඳ මෙම පක්‍ෂය එකඟවේ.

**බ්‍රිතාන්‍ය පක්‍ෂ ක්‍රමයේ ලක්‍ෂණ**

- ද්විපක්‍ෂ ක්‍රමයක් වීම.

"ද්වි පක්‍ෂ ක්‍රමයක් යනු ආණ්ඩු බලය දිනාගැනීමට තරම් හැකියාව ඇති පක්‍ෂ දෙකක් පමණක් පැවතීම ලෙස හැඳින්විය හැකිය."

- මධ්‍යගත කරණය

බ්‍රිතාන්‍යය දේශපාලන පක්‍ෂ අධික ලෙස මධ්‍යගත කරනය වී ඇත. ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ප්‍රබලව සංවිධාන ගත වී තිබීම. පක්‍ෂ මූලස්ථාන හා ප්‍රාදේශීය ඒකක අතර ඍජු සම්බන්ධතාවක් පැවතීම. සෑම පක්‍ෂයක්ම නායකත්වය වටා කේන්ද්‍රගතව පිහිටීම මීට අදාළව දැක්විය හැකි කරුණු වේ.

- **පක්ෂවල වැඩ අඛණ්ඩව පත්වාගෙන යාම.**

එංගලන්තයේ පක්ෂවල කාර්යයන් දෛනිකව සිදු වේ. එක් මැතිවරණයක් අවසන් වූ පසු ඊළඟ මැතිවරණයට සූදානම් වේ. ඔවුන් ස්වකීය ප්‍රචාරණ සහ අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යයි. සාහිත්‍යමය ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම , රැස්වීම් පැවැත්වීම. සති අන්ත සහ ග්‍රීෂ්ම ඍතුවේදී පංති පැවැත්වීම වැනි කරුණු ඉදිරිපත් කළ හැකිය. **'බ්‍රිතාන්‍යය දේශපාලන පක්ෂ නිරන්තරයෙන්ම පවතී... සෑම තැනින්ම පවතී.... වාචිකව ද පවතී'** යන්න ප්‍රසිද්ධ ප්‍රකාශනයකි.

- මධ්‍යස්ථකරණය

බ්‍රිතාන්‍යය පක්ෂ ක්‍රමය තුළ ඇති ඉතා වැදගත් සම්ප්‍රදායක් ලෙස මධ්‍යස්ථකරණය දැක්විය හැකිය. මෙම දේශපාලන පක්ෂ අන්තගාමී දේශපාලන පක්ෂ නොවේ.

නිදර්ශන : **සමාජවාදී** වැඩපිළවෙල **ප්‍රසිද්ධියේ පිළිගත් ලේබර් පක්ෂය පූර්ණ වශයෙන් සමාජවාදී හෝ කම්කරු** වාදී **නොවේ.** සියළුම කර්මාන්ත ජනසතු කිරීම යනුවෙන් ඔවුන් අදහස් නොකරයි. සියලුම සාමාජිකයන් කම්කරුවන් ද නොවේ. මෙලෙස ලේබර් වාදීන් සමාජ වාදී අදහස් මධ්‍යස්ථකරණයට පත් කර තිබේ.

නිදර්ශන : **කොන්සවේටිව් වාදීන් ද පූර්ණ කොන්සවේටිව් වාදීන් නොවේ.** කොන්සවේටිව් පක්ෂයේ සියලුම සාමාජිකයෝ රදළ ධනපති පැලැන්තියේ නොවෙති. සියලුම ව්‍යාපාරිකයෝ කොන්සවේටිව් පක්ෂයට ඡන්දය නොදෙති. මෙලෙස කොන්සවේටිව් වාදීන් ද ස්වකීය අදහස් මධ්‍යස්ථකරණයට පත්කොට ඇත.

- **විනයානුකූල බැඳීම.**

බ්‍රිතාන්‍යය පක්ෂ ක්‍රමය තුළ ඇති තවත් ලක්ෂණයක් වන්නේ විනයානුකූල බැඳීමයි. එයින් අර්ථවත් වන්නේ පක්ෂ නායකත්වයට සහ පක්ෂ ප්‍රතිපත්ති වලට සාමාජිකයන් අවනත විය යුතුය යන්න වේ. නොඑසේනම් ඔවුන් ඉවත්විය යුතුය. නැතිනම් පක්ෂ නායකත්වය විසින් එම විනයානුකූල බැඳීම නොමැති සාමාජිකයන් ඉවත් කරයි.

- **ප්‍රධාන දේශපාලන පක්ෂ එකිනෙකට හතුරු දේශපාලන පක්ෂ නොවීම සහ අන්‍යෝන්‍යය වශයෙන් ඇති සහයෝගය**

# වි රුද්ධ පක්‍ෂය

## හැඳින්වීම.

එංගලන්තයේ විරුද්ධ පක්‍ෂය ආණ්ඩුපක්‍ෂය තරමටම සංවිධාන ගත වූ පක්‍ෂයක් බව නිල වශයෙන් පිළිගත්තකි. එය රැජිණගේ විරුද්ධ පක්‍ෂය ලෙස හඳුන්වයි. සංවිධානගත වූ මෙන්ම නිලවශයෙන් පිළිගත් විරුද්ධ පක්‍ෂයක් තිබීම බ්‍රිතාන්‍යයටම සුවිශේෂී වූ ලක්‍ෂණයකි. බ්‍රිතාන්‍යය විරුද්ධ පක්‍ෂය ඉතා ශක්තිමත් එකකි. ඒ සඳහා බලපෑ හේතු සාධකය වන්නේ එරට ද්විපක්‍ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වීමයි.

ද්විපක්‍ෂ ක්‍රමය හරහා එක් පක්‍ෂයකින් ආණ්ඩුවක් එක් පක්‍ෂයකින් විරුද්ධ පක්‍ෂයක් නිර්මාණය වේ. මෙහි දී විරුද්ධ පක්‍ෂය තුළ එක් දේශපාලන පක්‍ෂයක් නියෝජනය වීම හරහා එය ශක්තිමත් විරුද්ධ පක්‍ෂයක් බවට පත්වෙයි. විරුද්ධ පක්‍ෂ නායකයා ඒකාබද්ධ අරමුදලින් පවුම් 44100 වැටුපක් ලබයි.

## විරුද්ධ පක්‍ෂ භූමිකාව (කාර්යභාරය)

- ආණ්ඩුව අවධිකර නියම මාර්ගවල ගමන් කරවීම.

  ආණ්ඩු පක්‍ෂය සිදු කරන කාර්යයන් දෙස සුපරික්‍ෂාකාරීව සිටීම. විරුද්ධ පක්‍ෂය සිදු කරනු ලබන වැදගත් හා ඵලදායී විවේචනයන් නිසා ආණ්ඩු පක්‍ෂය අනියම් මාර්ගවල ගමන් නොකරයි.

- ආණ්ඩුවේ දුර්වල යෝජනා වලදී විරුද්ධ වීම සහ යහපත් යෝජනා වලදී එකඟ වීම.

  මෙය ඉතා වැදගත් කාර්යකි. විරුද්ධ පක්‍ෂය වූ පමණින් සෑම කටයුත්තකටම බාධාකිරීම හරස් වීම දේශපාලනය නොවේ. දුර්වල යෝජනා වලදී බාධාකිරීම සහ යහපත් සාර්ථක යෝජනා වලදී එයට සහය දැක්වීම විරුද්ධ පක්‍ෂයේ වැදගත් භූමිකාවක් වේ. දුර්වල යෝජනා ප්‍රතික්ෂේප කිරීම පමණක් ප්‍රයෝජන නැත. ඊට අදාළ නිවැරදි සාර්ථක යෝජනා ඉදිරිපත් කළ යුතු ය.

- ප්‍රජාතන්ත්‍රවාදය මනාව ක්‍රියාත්මක වීමට අදාළ පදනම සැපයීම.

  ආණ්ඩු පක්‍ෂය තරමටම විරුද්ධ පක්‍ෂයත් ශක්තිය පවත්වා ගැනීමට සමත්විය යුතුය. එය වැදගත් දේශපාලනික කාර්ය භාරයකි. විරුද්ධ පක්‍ෂයේ ශක්තිමත් භාවය මත ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර ස්වරූපය රදා පවතී. එම නිසා විරුද්ධ පක්‍ෂය ස්වකීය ශක්තිය ආරක්‍ෂා කරන ගත යුතු ය.

o <u>විරුද්ධ පක්ෂය පමණක් නොව රජිණගේ විකල්ප ආණ්ඩුව යන කාරණය විශද කිරීම.</u>

රජිණගේ විකල්ප ආණ්ඩුව වන බැවින් විපක්ෂය ඉතා වැදගත් වේ. එම නිසා ආණ්ඩු බලය අල්ලා ගැනීම සඳහා පවතින ආණ්ඩුව විසින් සිදු කරනු ලබන ප්‍රජාතාන්ත්‍රික නොවන ක්‍රියාමාර්ග, ආණ්ඩුවේ දුර්වලතාවයන් ජනතාව වෙතට ගෙන යමින් මීළඟ ආණ්ඩුව නිර්මාණය කිරීමට අදාළ කටයුතු සම්පාදනය කිරීම මීට අදාළ වේ.

තවදුරටත් විරුද්ධ පක්ෂය තුළ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය විකල්ප කැබිනට් මණ්ඩලයක් ද සකස් කරගෙන ඉතා විමසිල්ලෙන් යුතුව කටයුතු කරයි. එහි නම **ඡායා කැබිනට් මණ්ඩලය** නම් වේ. ඒ හරහා ආණ්ඩු කිරීමේ කලාව පිළිබඳව විරුද්ධ පක්ෂය පුහුණුවක් නිරන්තරයෙන්ම ලබයි.

● <u>**ආණ්ඩු පක්ෂය හා විරුද්ධ පක්ෂය අතර ඇති වැදගත් ලක්ෂණ.**</u>

- එකිනෙකට සතුරු දේශපාලන පක්ෂ දෙකක් නොවීම.
- පක්ෂ දෙක සහයෝගයෙන් යුතුව කටයුතු කිරීම.

මෙම කරුණු විග්‍රහකරනුයේ නම් පක්ෂ දෙකම ප්‍රබල පක්ෂ වීම හරහා සහයෝගය රඳවාගෙන තිබේ. එමෙන්ම පක්ෂ අතර ඇති ඇතැම් ප්‍රතිපත්ති තුළ ඇති සමාන පක්ෂ නායකයා මී ලඟ අගමැතිවරයා වේ. ඔහු හඳුන්වන්නේ රජිණගේ **විකල්ප අගමැතිවරයා** නමිනි. "**අගමැතිවරයා තම භාර්යාවට වඩා හොඳින් විරුද්ධ පක්ෂ නායකයා හඳුනයි...**" වැනි ප්‍රකාශ තුළින් පැහැදිලි වන්නේ එම පක්ෂ අතර ඇති සම්බන්ධතාවයයි.